# ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ විකාසනය සහ ස්වාධීන රාජ්‍යයක් වීම පිළිබඳ සරල හඳුනාගැනීමක්

(1833 සිට 1972 තෙක්)

වටරක්ගොඩ සුමන හිමි

## ලංකාවේ ආණ්ඩුක්‍රම ආරම්භ වීමේ පසුබිම

ක්‍රිස්තු පූර්ව තුන්වන සියවස දක්වා ඈත අතීතයකට උරුමකම් කියන ලිඛිත සාධක සහිත ලංකාව තුළ දහනව වන සියවස දක්වාම පැවතියේ රාජාණ්ඩු ක්‍රමයේ පාලන ක්‍රමයක් බව හඳුනාගත හැකිය. එනම් විධායක, ව්‍යවස්ථා, අධිකරණ යන ත්‍රිවිධ බලතල රජු වටා කේන්ද්‍රගතව පැවතීමයි. ලංකාව තුළ පැවති මෙකී තත්ත්වය පෘතුගීසි ආගමනයෙන් හෝ ලන්දෙසි ආගමනයෙන් කිසිදු වෙනසකට බඳුන් නොවීය. එසේ වෙනසකට බඳුන් නොවීමට ප්‍රමුඛ වශයෙන් බලපෑවේ එම විදේශිකයන්ට ලංකාව සම්පූර්ණයෙන්ම යටත් කොට ගත නොහැකි වීමයි.

එහෙත් 1796 දී පමණ ලංකාවේ මුහුදුබඩ පළාත් යටත් කරගනිමින් මෙරට අර්ධ ආධිපත්‍යයකට හිමිකම් කීමේ අයිතිය ක්‍රමිකව ලබාගත් බ්‍රිතාන්‍යයන්ගේ ආක්‍රමණයන්ගෙන් පසුව උක්ත සියවස් ගණනාවක තත්ත්වය වෙනස් මාවතක් කරා අවතීර්ණ වන්නට විය. 1815 දී ලංකාව සම්පූර්ණයෙන්ම බ්‍රිතාන්‍යයන්ට යටත් වූ අතර මෙම වර්ෂයේම මාර්තු දෙවන දින අත්සන් කළ ඓතිහාසික කන්ද උඩරට ගිවිසුමෙන් එතෙක් ලංකාවේ පැවති රාජාණ්ඩු ක්‍රමය අහෝසි කර දමන ලදී.[1] ඉන් අනතුරුව ලංකාව සම්බන්ධිත සියලු දේශපාලන අධිකාරීමය බලතල බ්‍රිතාන්‍ය කිරීටය යටතට පවරා ගන්නා ලද අතර කිරීටය විසින් පත්කරනු ලැබූ ආණ්ඩුකාරවරයෙකු යටතේ ලංකාව පාලනය විය.



මෙලෙස 1815 න් පසුව ලංකාව තුළ නව පාලන ව්‍යුහයක් ස්ථාපිත වූයේ නමුදු හරයෙන් එකී පාලන ක්‍රමයත් ඊට පෙර ලංකාවේ පැවති රාජාණ්ඩු පාලන ක්‍රමයත් අතර ප්‍රබල වෙනසක් දැකගත නොහැකි විය. මන්ද පෙර පාලන ක්‍රමය තුළ ව්‍යවස්ථා, විධායක, අධිකරණ යන ත්‍රිවිධ බලතල රජුවටා කේන්ද්‍රගතව පැවති අතර එකී බලතල බ්‍රිතාන්‍ය පාලනය යටතේ ආණ්ඩුකාවරයා සතු වීම හේතුවෙනි. කෙසේ වෙතත් ලංකාවේ ආණ්ඩුක්‍රම ක්‍රියාවලිය තුළ පරිකෘතිකමය වශයෙන් සිදුවූ වෙනස් කමක් දශක ගණනාවක් යන තුරුම විද්‍යමාන නොවීය. ආණ්ඩුක්‍රමය පිළිබඳව සම්පූර්ණ වශයෙන් නොවූවත් යම් ආකාරයක හෝ වෙනසක් දැක ගැනීමට හැකිවන්නේ කෝල්බෘක්-කැමරන් නම් වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වීමෙන් පසුවය.

## කෝල්බෘක්-කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ

### පසුබිම

කෝල්බෘක්-කැමරන් කවුරුන්ද යන වග සහ ඔවුන් විසින් ඉදිරිපත් කරනලද ප්‍රතිසංස්කරණ මොනවාද යන්න විමසීමට මත්තෙන් මෙබඳු කොමිසමක් ලංකාවට එවීමේ පසුබිම සොයා බැලිය යුතුය. එහිදී මුලින්ම අවධානය යොමු කළ යුත්තේ එංගලන්තය දෙසටය. දහහත්වෙනි සහ දහඅටවෙනි සියවස්වල එංගලන්තය නිර්මාණය වීමෙහිලා ප්‍රධාන වශයෙන් විප්ලවයන් තුනක් බලපා තිබේ. ඒවානම් ප්‍රංශ විප්ලවය, කාර්මික විප්ලවය හා ඇමරිකන් විප්ලවයයි.

ප්‍රංශ විප්ලවයෙන් මතු වූ මිනිස් සමානාත්මතාවය, සහෝදරත්වය හා නිදහස පිළිබඳ අදහස් ඉක්මනින් යුරෝපයේ වෙනත් ප්‍රදේශවලටද පැතිර ගියේය.[2] එහි බලපෑමෙන් මිදීමට එංගලන්තයටද නොහැකි විය. ප්‍රංශ විප්ලවයට හා එයින් මතු වූ අදහස්වලට පක්ෂව මෙන්ම විපක්ෂව ද චින්තකයින් සහ ලේඛකයින් එංගලන්තය තුළ බිහිවිය. ඔවුන් අතරින් වඩාත් ප්‍රසිද්ධ තොමස් පේන් මිනිස් අයිතිවාසිකම් හුවා දක්වමින්

ප්‍රතිසංස්කරණවාදීන් උසිගැන්වූ අතර එඩ්මන් බර්ක් ප්‍රංශ විප්ලවයෙන් මතුවූ තර්ජන පෙන්වා දී පාලකයින් බිය ගැන්වීය.[3] මෙම පසුබිම මෙසේ පවතින අතරතුර 1815 වන තෙක්ම එංගලන්තය ප්‍රංශයේ නැපෝලියන්ට විරුද්ධව යුධ වැදුණු අතර එයින් ප්‍රංශය පරාජය කිරීමට සමත් විය.[4] එහෙත් ප්‍රංශ විප්ලවයෙන් උපන් අදහස් මර්දනය කිරීමට එංගලන්තයට නොහැකි විය. ප්‍රංශ විප්ලවය වෙතින් ප්‍රකාශිත චින්තනයන් වෙත එංගලන්තයේ ජනයා ඇදී ගියේ එම චින්තනයන් වර්ධනය වීමට අවැසි පරිසරය සකසන තවත් විප්ලවයක් එංගලන්තය තුළ සිදු වූ බැවිනි. එනම් කාර්මික විප්ලවයයි.[5] කාර්මික විප්ලවය විසින් එංගලන්තයේ ඇති කරනලද සමාජමය විපරීතයන් සහ ප්‍රංශ විප්ලවය විසින් ඇති කරවන ලද චින්තනමය විපරීතයන් විසින් ලිබරල් වාදය සහ උපයෝගීතා වාදය මෙකල බිහිවන්නට විය. මෙකී දර්ශනයන් මගින් බිහි වූ පුද්ගලයෝ පොදුවේ ගත් කල පෞද්ගලික නිදහස ගරුකළ, වැඩවසම් සංස්ථාවලට එරෙහි, රාජ්‍ය නිර්බාධ ප්‍රතිපත්තිය ගරුකළ, වහල් මෙහෙයට විරුද්ධ මතවාදයන් දරූ පිරිස් වූහ. මෙකී අදහස් දරූ රැඩිකල් පිරිසක් බ්‍රිතාන්‍ය පාර්ලිමේනතුව ද නියෝජනය කළ අතර ඔවුන් විසින් බ්‍රිතාන්‍ය යටත් විජිත ප්‍රතිපත්තිය දැඩි ලෙස විවේචනය කළහ. යටත් විජිත, බ්‍රිතාන්‍යයන්ට ප්‍රයෝජනවත් නොවූවා සේම මහත් බරක් ද වී ඇති බව මොවූහු පෙන්වා දුන්හ. මෙබදු තත්ත්වයක් ඇතිවීමට ප්‍රධාන හේතුව ලෙස මොවුන් දුටුවේ බ්‍රිතාන්‍ය රජය විසින් සාවද්‍ය ප්‍රතිපත්ති අනුගමනය කිරීමත් පුද්ගලික දියුණුව පවත්වාගෙන යාමට බාධා පමුණුවන සංස්ථා පවත්වාගෙන යාමත්ය.

ලංකාවේ අනුගමනය කරන ලද ඇතැම් රාජ්‍ය ප්‍රතිපත්තීන් ද බ්‍රිතාන්‍ය රජය විසින් ලංකාව තුළ පවත්වාගෙන යන යම් යම් සංස්ථා ද උක්ත උපයෝගීතාවාදීන්ගේ ප්‍රබල විවේචනයට හසුව තිබුණි. සාමාන්‍යයෙන් ඒකාධිකාරී ආර්ථික රටාවක් සහ වැඩවසම් සමාජ ක්‍රමයක් පවත්වාගෙන යාමට විරුද්ධව මෙම විවේචන එල්ල වූ බව හඳුනාගත හැකිය. වෙළඳ ඒකාධිකාරය ඉවත් කිරීම, රාජකාරී ක්‍රමය අහෝසි කිරීම සහ ඉඩම් භුක්තිය



පිළිබඳ වැඩවසම් නීතිරීති වෙනස් කිරීම කෙරෙහි ද මොවුන්ගේ අවධානය යොමු වූ බව පෙනෙයි. පුද්ගලික ව්‍යවසායකත්ව දියුණුවට ඉහත තත්ත්ව ආධාර නොවන බව මෙම උපයෝගීතා වාදීන්ගේ මතය විය. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව නියෝජනය කළ රැඩිකල්වාදීන්ගේ අවධානය වැඩි වශයෙන් යොමු වූයේ බ්‍රිතාන්‍යයේ වෙළඳාම පුළුල් කිරීම සහ මූලධන ආයෝජනයට අනුබල දීම කෙරෙහිය. එහෙත් ලංකාවේ පැවති තත්ත්වය මේ සඳහා බාධාවක් ලෙස සලකන ලදී. එංගලන්තයෙන් ලංකාවට පදිංචිකරුවන් නොපැමිණෙන්නේ මන්ද යන ප්‍රශ්නය බ්‍රිතාන්‍ය තුළ මතු වූ විට ජෝසෆ් හියුම් ප්‍රකාශ කළේ නිදහසක් නොමැති රටකට යන්නේ කවුද යනුවෙනි.[6]

දහනව වන සියවසේ බ්‍රිතාන්‍ය යටත් විජිත සම්බන්ධයෙන් න්‍යාය පත්‍ර සැකසීමේදී උක්ත තත්ත්වයන්ට අමතරව බලපෑම් කරන ලද තවත් කාරණාවක් ලෙස ඇමරිකන් විප්ලවය හඳුනාගත හැකිය.[7] දහ නව වන සියවස තෙක්ම යටත් විජිත සමබන්ධයෙන් බ්‍රිතාන්‍යන් අනුගමනය කරන ලද්දේ වක්‍ර පාලන ක්‍රමයකි. එහෙත් 1776 ඇරඹි ඇමරිකන් විප්ලවය නිසා යටත් විජිත සම්බන්ධිත එකී වක්‍ර පාලන ක්‍රමය අසාර්ථක බවට මතයක් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව තුළ ගොඩ නැගුණු අතර ඒ වෙනුවට යටත් විජිතයන්හි ඍජු පාලන ක්‍රමයක් අනුගමනය කිරීමට යෝජනා කෙරුණි. කෝල්බෲක්-කැමරන් යෝජනා ලංකාවට එළඹීමට ප්‍රථම බ්‍රිතාන්‍ය තුළ පැවති තත්ත්වය කවරාකාරදැයි මෙලෙසින් හඳුනාගත හැකිය.

## කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණයන්හි ආගමනය සහ එහි ව්‍යුහය

"These changes were due mainly to developments in Britain and helped considerably a comparatively small island with a medieval social and economic system to attainwithin twelve decades and becomean equal partner in the commonwealth of national"[8] යනුවෙන් දක්වන ජී.සී. මෙන්ඩිස් මහතා, වසර දෙකක් තුළ කරන ලද මෙම කොල්බෲක්-

කැමරන් යෝජනා අවුරුදු 120කට පමණ බලපාන ලද බව පෙන්වා දෙයි.

මෙලෙස සියවසකට අධික කලයක් පුරාවට බලපෑම් කිරීමට සමත් වන යෝජනා මාලාවක් ක්‍රියාත්මක වීමට බලපාන ලද බ්‍රිතාන්‍යමය තත්ත්වයන් පූර්වයෙන් සාකච්ඡා කළ ද ඒ සඳහා බලපාන ලද ලාංකේයමය තත්ත්වයන් විමසුමට බඳුන් නොකෙරුණි. බ්‍රිතාන්‍යයන් ලංකාවේ ආධිපත්‍ය පිහිටුවා පළමු වසර 27ක කාලය තුළ මෙරටේ පාලන කටයුතු සඳහා මව් රජය සම්බන්ධ වූයේ කලාතුරකිනි. එහෙත් ලංකාවේ ආණ්ඩුකාරවරු මෙරට පාලන කටයුතු කරගෙන යාමට අවශ්‍ය ප්‍රතිපාදන නිතරම බ්‍රිතාන්‍ය භාණ්ඩාගාරයෙන් ඉල්ලීමත් සමඟින් ශ්‍රී ලංකාවේ කටයුතු කෙරෙහි වැඩි අවධානයක් මව් රජය දක්වන්නට විය. එහි ප්‍රතිඵලයක් වූයේ කෝල්බෲක් කොමිසම පත්කිරීමයි.

බ්‍රිතාන්‍ය යටත් විජිත කාර්යාලය 1823 ජනවාරි 18 වැනි දින කිරීට යටත් විජිත දෙකක් එනම් සුභ ප්‍රාර්ථනා තුඩුවේ සහ මුරුසි දිවයිනේ ඉහත පෙන්වාදුන් ආකාරයේ තත්ත්වයන් උද්ගත වූයෙන් එහි කටයුතු පරීක්ෂා කිරීම සඳහා පත්කරන ලද රාජකීය කොමිසමේ විෂය ක්ෂේත්‍රය ශ්‍රී ලංකාවේ කටයුතු සොයා බැලීම සඳහා ද පුළුල් කෙරුණි.[9] ඒ අනුව 1829 දී ඉහත යටත් විජිත දෙකෙහි කටයුතු සමාප්ත කළ කොමිසම 1829 අප්‍රේල් 11 වන දින පෙරදිග රාජ්‍යයන් පිළිබඳව අත්දැකීම් බහුල විලියම් මැක්බීන් ජෝර්ජ් කෝල්බෲක් නමැති ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරයා ලංකාවට එවීය. එපමණක්ම නොවේ ඉන් ටික කලකට පසුව ලංකාවේ අධිකරණ සහ නීතිමය කටයුතු පිළිබඳව සොයා බැලීම සඳහා ස්කොට්ලන්ත ජාතික චාල්ස් හේ කැමරන් නමැති නීතිවේදියා ද 1830 මාර්තු 30 වන දින ලංකාවට පැමිණියේය. මෙසේ පැමිණි මෙම දෙදෙනාගේ යෝජනා මත ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ ලෙස හඳුන්වයි.

කෙසේ වෙතත් ලංකාවේ පවතින දේශපාලනමය ව්‍යුහය වෙනස් කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට අවශ්‍ය නිරීක්ෂණ



සිදුකිරීම මෙම කොමිසමට පහසු කටයුත්තක් නොවීය. නිදහස් පුවත්පත් හෝ සංවිධාන නොතිබීමත් විශේෂයෙන්ම කොමිසමට විරුද්ධත්වයක් දැක්වූ එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරයා පාලන තන්ත්‍රය මෙහෙය වීමත් එයට ප්‍රධාන වශයෙන්ම හේතු විය.[10] මෙබඳු දුෂ්කර තත්ත්වයක් යටතේ ලංකා පරිපාලන ව්‍යුහයේ ඇතිකළ යුත්තේ කෙබඳු ආකාර වෙනසක් දැයි පරීක්ෂා කිරීම සඳහා කෝල්බෲක් විසින් ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදයක් අනුගමනය කළේය. එහිදී යටත් විජිතයේ පදිංචිව සිටි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට, විශිෂ්ට දේශීය හා යුරෝපයේ වැසියන් වෙත යවන ලද ප්‍රශ්නාවලියකින් ලබාගත් තොරතුරු සහ ඔහු වෙත ලැබුණු පෙත්සම් තොරතුරු අධ්‍යයනය සඳහා භාවිත කළේය. ඊට අමතරව සාක්ෂිකරුවන්ගෙන් ප්‍රශ්න ඇසීමෙනුත්, රට තුළ සංචාරය කිරීමෙනුත් රජයේ දෙපාර්තමේන්තු හා ලේඛන පරීක්ෂා කිරීමෙනුත් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට සමත් විය. මෙලෙස තම අධ්‍යයනය සඳහා අවශ්‍ය තොරතුරු එක් රැස් කරගත් කෝල්බෲක් 1831-1832 කාලවකවානුව තුළ යටත් විජිත කාර්යාලයට වාර්තා 04 ක් ඉදිරිපත් කළේය. ඒ මෙසේය,

1. ලංකාවේ රාජ්‍ය පරිපාලනය පිළිබඳ වාර්තාව.
2. ලංකාවේ ආදායම පිළිබඳ වාර්තාව.
3. රාජකාරි ක්‍රමය පිළිබඳ රහස්‍ය වාර්තාව.
4. ලංකාවේ ආයතන සහ වැය පිළිබඳ වාර්තාව.

යනුවෙනි. මෙම වාර්තාවට අමතරව ලංකාවේ අධිකරණ සහ නීති පද්ධතිය පිළිබඳව අධ්‍යයනයට පැමිණි කැමරන් විසින් 1832 ජනවාරි 31 වැනි දින රාජ්‍ය අධිකරණ හා ක්‍රියාවලිය නමින් වාර්තාවක්ද ඉදිරිපත් කළේය.

සමස්තයක් වශයෙන් ලංකාවේ පරිපාලන ව්‍යුහය පිළිබඳ විස්තර මෙකී වාර්තා පහ (05) මඟින් බ්‍රිතාන්‍ය කිරීටය වෙත කෝල්බෲක් සහ කැමරන් විසින් ඉදිරිපත් කරන ලදී. ලංකාවේ ප්‍රථම වතාවට සිදුකෙරෙනු මෙකී පර්යේෂණ වාර්තාවන්හි අන්තර්ගතය මදක් විමසිය යුතුය.

## රාජ්‍ය පරිපාලනය පිළිබඳව කොල්බෘක්ගේ වාර්තාව හා අධිකරණය පිළිබඳ කැමරන් යෝජනා

විවිධ අනුමාතෘකා තිස් නවයක් යටතේ ඉදිරිපත් කොට ඇති මෙකී වාර්තාවේ මුල්ම අනුමාතෘකා එකළොසින් දිවයිනේ භූ-සිතියම් පරිසරය, පස හා භූ විද්‍යාව, දේශගුණය, ජනගහනය, කුල, පුරාණ ආණ්ඩු ක්‍රම යන විෂයන් යටතේ ලංකාවේ සාමාන්‍ය විස්තර දක්වා තිබේ. මෙකී තොරතුරු වලට අමතරව රාජ්‍ය පරිපාලනය සම්බන්ධිත වැදගත්ම තොරතුරු දක්නට ලැබෙන්නේ ඉතිරි අනුමාතෘකා 28 තුළය.

එකී මාතෘකා 28 තුළ දක්නට ලැබෙන වැදගත් යෝජනා ලෙස යුරෝපීන්ට මෙරටේ පදිංචියට අවසර දී ඉඩම් වගාවේ දියුණුව යෝජනා කිරීම, විදේශීන්ට ඉඩම් ලබාදීම රාජ්‍ය සේවා ව්‍යවස්ථා දායක සභාවක් ඇති කිරීමට යෝජනා කිරීම, ජනාවාස ඇති කිරීම පිළිබඳ යෝජනා, ගම්පති ක්‍රමය තව දුරටත් තබාගැනීම, විහාර ඉඩම්වල සේවා භුක්තිය, මෙරට දැනුම ව්‍යාප්ත කිරීම හා මුද්‍රණාල ඇති කිරීම යෝජනා ආදිය පෙන්වා දිය හැකිය.

මේ ආදී වූ ප්‍රධාන යෝජනාවලි හරහා ලංකාවට ගැලපෙන පාලන ක්‍රමයක් යොජනා කිරීමට කෝල්බෘක් උත්සාහදරා තිබේ. මෙකී යෝජනා අතර ඉතා වැදගත් යෝජනාවක් වූයේ මෙතෙක් ස්වාධීන පරිපාලන ඒකක දෙකක් ලෙස පැවති උඩ රට සහ පහත රට ප්‍රදේශ එක් පරිපාලන ව්‍යුහයක් තුළට ගෙන ඒම සඳහා කරන ලද යෝජනාවයි. උඩ රට පැවති කොමසාරිස් මණ්ඩලයේ පාලනය අහෝසි කරමින් දිවයින පළාත් පහකට බෙදා කොළඹ, ගාල්ල, යාපනය, ත්‍රිකුණාමලය හා නුවර යන නගරවල පරිපාලන මධ්‍යස්ථාන පිහිටුවීමට යෝජනා කළේය. මෙලෙස ලංකාවේ එතෙක් පැවති පරිපාලන ක්‍රමය ව්‍යුහාත්මකව පරිකෘතික වෙනසකට බඳුන් කිරීමට අවශ්‍ය යෝජනා ප්‍රථම වතාවට කෝල්බෘක් විසින් ඉදිරිපත් කෙරුණි.

එපමණක්ම නොවේ ආණ්ඩුකරු විසින් අත්පත්කරගෙන සිටි ඇතැම් ඒකාධිපති බලතල ඉවත් කිරීමටත් ඔහුගේ කටයුතු

16 OCT 2017
පුස්තකාලය




පිළිබඳ වගකීම ඇතිවන පරිදි ආණ්ඩු ක්‍රමය සැකසීමටත් විධායක සහ අධිකරණ විෂයක්ෂේත්‍රය ගැන පැහැදිලිව බෙදා විග්‍රහ කිරීමටත් කොල්බෘක් අදහස් කළේය. ඒ අනුව ඔහු විසින් ආණ්ඩු ක්‍රමයේ වෙනස්කම් කීපයක් කිරීමට යෝජනා කරන ලදී. ආණ්ඩුකාරවරයාගේ බලතල සීමාකිරීමට යෝජනා කිරීම එම යෝජනා අතර ප්‍රමුඛතාවක් ගත්තේය. 1815 උඩ රට ගිවිසුම අනුව උඩ රට පාලනය පිළිබඳ සියලු බලතල හිමි වූ ආණ්ඩුකරුට, කිසිදු නඩු විභාගයකින් තොරව මිනිසුන් අත් අඩංගුවට ගැනීමටත් පිටුවහල් කිරීමටත් බලය ලැබී තිබුණි. උඩ රට ප්‍රදේශවල නීති පැනවූයේ ආණ්ඩුකරුගේ ප්‍රකාශනයකින් නිසා තනි කැමැත්තට ක්‍රියා කළ හැකි වූ අතර පහතරට ප්‍රදේශවල නීති පැනවීමේදී උපදේශන සභාවේ අනුශාසනා ලැබිය යුතු විය. එහෙත් එම මණ්ඩලය ද ආණ්ඩුකරු විසින්ම පත්කළ නිසා ස්වාධීන මණ්ඩලයක් නොවීය. මෙබඳු තත්ත්ව නිසා ආණ්ඩුකරුගේ බලය ඉතා ඉහළ තත්ත්වයක පැවතුණි. මෙනිසා පාලනයට අඩුවෙන්ම මැදිහත් වන රජය ඉතාම සාධාරණ යැයි සැලකූ රාජ්‍ය නිර්බාධවාදී ප්‍රතිපත්තිය පිළිගත් කෝල්බෘක්, ආණ්ඩුකාරයාගේ අසීමිත බලතල ඉවත්කර බලතල පැහැදිලි ලෙස විග්‍රහ කොට සීමාවකට ගෙන ඒමට අවශ්‍ය පසුබිම සැකසීය.[11]

එහිදී ආණ්ඩුකාරයා වෙත ඒකරාශී වී ඇති ව්‍යවස්ථා, විධායක සහ අධිකරණ යන ත්‍රිවිධ බල තල වෙන් කිරීම සඳහා අදහස් කළ කෝල්බෘක් ව්‍යවස්ථා පැනවීමේ දී මෙතෙක් වැදගත් ලෙස ක්‍රියා නොකළ උපදේශක සභා වෙනුවට ඊට වඩා බලවත් සංස්ථා ස්ථාපිත කිරීමේ අපේක්ෂාවෙන් ව්‍යවස්ථා සහ විධායක සභා දෙකක් ඇති කිරීමට යෝජනා කළේය.ව්‍යවස්ථා සහ විධායක කටයුතු වෙන් කිරීමේ අටියෙන් මේ දක්වා ආණ්ඩුකාරයාගේ උපදේශක සභාවේ සාමාජිකයෙකු වූ අග්‍ර විනිශ්චයකාර තුමා විධායක සභාවේ සාමාජිකයෙකු නොවිය යුතු බව ද ඔහු පෙන්වා දුන්නේය.

මෙම ව්‍යවස්ථාදායක සභාවට රජයේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්, නීතිපති හා කොළඹ දිසාපති ඇතුළු යුරෝපීයන් ද

ස්වදේශිකයන්ගෙන් සම්භාවනීය පුද්ගලයන් කිහිපදෙනෙකු ද ඇතුළත් වන ලෙස ස්වකීය නිර්දේශ ලබාදුණි. එසේම ආණ්ඩුකාරයාගේ බලපෑමෙන් මෙම සභාව ඈත් විය යුතු බව පෙන්වාදුන් කෝල්බෲක් ආණ්ඩුකාරවරයා සභාවාර වලට සහභාගී වීමෙන් වැලකිය යුතු බවද පෙන්වාදුන්නේය. ආණ්ඩුකාරවරයාගේ බලපෑම්වලින් තොරව අණ පනත් සම්මත කිරීමට අවස්ථාව සැලසෙන පරිදි නව සංස්ථා සැකසීමට ද යෝජනා ඉදිරිපත් කළේය.

මෙබඳු කොන්දේසි මත ඇතිකරන ලද ව්‍යවස්ථාදායක මණ්ඩලය නිලලත් නිලධාරීන් නවදෙනෙකුගෙන් සහ නිල නොලත් නිලධාරීන් සය දෙනෙකුගෙන් යුක්ත විය. නිල නොලත් මන්ත්‍රීවරුන් ලෙස පත් වූයේ යුරෝපීය ජාතිකයන් තිදෙනෙක් සහ සිංහල, ද්‍රවිඩ, බර්ගර්, යන ජාතීන්ගෙන් එක් අයෙකු වශයෙනි. විධායක සභාවට උක්ත නිලලත් නිලධාරීන් නවදෙනා අතරටරාජ්‍ය ලේකම්වරයා, භාණ්ඩාගාරික, විගණන ජෙනරාල්වරයා, මිනින්දෝරු ජෙනරාල්වරයා, කොළඹ තීරුබදු අයකරන නිලධාරියා සහ කොළඹ දිස්ත්‍රික් රජයේ ඒජන්තවරයා ද අයත් විය.






පරිපාලන වාර්තාව මගින් ප්‍රධාන වශයෙන් උක්ත යෝජනාවන් ඉදිරිපත් කළ අතර ඊට අමතරව ලංකාවේ ආදායම පිළිබඳ වාර්තාව, රාජකාරී ක්‍රමය පිළිබඳ රහස්‍ය වාර්තාව හා ලංකාවේ ආයතන සහ වැය පිළිබඳ වාර්තාව මගින් තවත් යොජනා රැසක් ඉදිරිපත් කොට තිබේ. එකී යෝජනා අතරින් රාජකාරී ක්‍රමය අහොසි කිරීම, විශ්‍රාම වැටුප් අහෝසි කිරීම, පෞද්ගලික ව්‍යවසායකත්වය පුළුල් කිරීම, නිදහස් වෙළඳ සමාජයක් ඇතිකිරීම, වක්‍ර බදු ක්‍රම යෝජනා කිරීම, සමහර දෙපාර්තමේන්තු අහෝසි කිරීම, අරක්කු පෙරීමේ ඒකාධිකාරය අහෝසි කිරීම, බ්‍රිතාන්‍ය ඒකාධිකාරය අහෝසි කිරීම, බ්‍රිතාන්‍ය මුදල් ක්‍රමය හඳුන්වාදීම, අධ්‍යාපනය පුළුල් කිරීම හා අධ්‍යාපන මාධ්‍යය ඉංග්‍රීසි කිරීමණි ඉඩම් නීති වෙනස් කිරීම[13] ආදී යෝජනා ප්‍රමුඛ යෝජනා ලෙස පෙන්වාදිය හැකිය.

මේ ආකාරයට කෝල්බෘක් විසින් ලංකාවේ පරිපාලන ක්ෂේත්‍රය සඳහා හඳුන්වා දෙන ලද ව්‍යුහාත්මක වෙනස්කම් තුළ ප්‍රජාතන්ත්‍රීය බවක් දක්නට ලැබුන ද ව්‍යවස්ථාදායක සභාවේ සභාපතිවරයා ආණ්ඩුකාරයාම වීමත් විධායක සභාවේ සියලු සාමාජිකයන් රාජ්‍ය නිලධාරීන් වීමත් නිසා ආණ්ඩුකාරයාගේ බලතල සැබෑවටම අඩුවී ද යන්න පිළිබඳව ගැටලු සහගත බවක් පැන නගී. ඒ කෙසේ වෙතත් ලංකාවේ නූතන ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණයන්හි මූල බීජ මෙම යෝජනා හරහා රෝපණය වීම සිදුව ඇති බව පැහැදිලියි

ලංකාවේ ප්‍රථම වතාවට යෝජිත උක්ත ප්‍රතිසංස්කරණ හා සබැඳි අනෙක් පාර්ශ්වය වූයේ අධිකරණ ක්ෂේත්‍රය සමබන්ධයෙන් කැමරන් විසින් කරන ලද යෝජනාවන්ය. විධායකයෙන් හා ව්‍යවස්ථාදායකයෙන් වෙන්වූ ස්වාධීන අධිකරණ පද්ධතියක පැවැත්මට අවශ්‍ය යෝජනා ඒ හරහා ඉදිරිපත් කෙරුණි. න්‍යායාත්මක අතින් පූර්ණ වශයෙන් ජෙරමි බෙන්තම් වාදියෙකු ලෙස පෙනෙන කැමරන් මෙරට ජනතාවගේ සිතුම් පැතුම් ස්පර්ශ නොකරන ආකාරයේ අධිකරණ ක්‍රමයක් යෝජනා කරන ලද බව ඇතැම් වියතෙකුගේ මතය වේ.

කෙසේවෙතත් කැමරන් ලංකාවට පැමිණෙන සමයේ මෙහි ක්‍රියාත්මක වන්නේ වැය අධික කරදරකාරී අධිකරණ ක්‍රමයක් බව ඔහු හඳුනා ගත්තේය. එම නිසා කැමරන්ට අවශ්‍ය වූයේ 1796-1833 දක්වා මෙරට ක්‍රියාත්මක වූ අධිකරණ ක්‍රමයට වඩා වෙනස්, වඩා සරල, වැඩි වැයක් නොදැරිය යුතු අධිකරණ ක්‍රියාවලියක් ඇති කිරීමටය. ශ්‍රේෂ්ඨාධිකරණය ලංකාවේ උසස්ම ආයතනය විය යුතු බව යෝජනා කළ හෙතෙම ප්‍රධාන නගරවල දිස්ත්‍රික් උසාවි පිහිටුවීමටත් ඒවායේ විනිසුරුවන්ට ලංකිකයන්ගේ සිරිත් විරිත් හා සමාජ පැවතුම් ආදිය ගැන අවබෝධයක් ලබාගැනීමට පහසුවනු සඳහා උපදේශක මණ්ඩලයක් පත්කිරීමටත් යෝජනා කෙරුණි. එසේම යුරෝපීයයන් හා ලාංකිකයන් සම්බන්ධව එකම අධිකරණ ක්‍රමයක් ඇතිකිරීමට ද යෝජනා කළේය. මෙහිදී ඉදිරිපත් වූ විශේෂිතම යෝජනාව වූයේ ආණ්ඩුකාරවරයා හෙවත් විධායකය කිසි ලෙසකින් අධිකරණයට ඇඟිලි නොගැසිය යුතු බව යෝජනා කිරීමයි. මෙබඳු යෝජනා ඉදිරිපත් කිරීමෙන් කැමරන් මූලික වශයෙන්ම බලාපොරොත්තු වූයේ යටත් විජිතයේ මනා පාලනයක් පවත්වාගෙන යාම සඳහා අධිකරණය ස්වාධීන ආයතනයක් ලෙස ගොඩ නැංවීමයි.

මෙලෙස කෝල්බෲක් හා කැමරන් දෙදෙනා විසින් එකතුව කරන ලද පරිපාලනමය හා අධිකරණමය යෝජනා 1833 න් පසුව ලංකාව තුළ නෛතිකමය වශයෙන් ක්‍රියාත්මක වීම ඇරඹීය. එතැන් පටන් දශක හතකට අධික කාලයක් ලංකාවේ පාලන ව්‍යුහය ක්‍රියාත්මක වූයේ උක්ත රෙගුලාසි වලට අනුවය. මෙකී ප්‍රතිසංස්කරණයන්හි 1889 නිල නොලත් සාමාජික සංඛ්‍යාවට උඩ රට සිංහලයන් හා මුස්ලිමුන් වෙනුවෙන් තවත් නිලධරයන් දෙදෙනෙකු පත්කිරීම හැර 1912 දක්වාම කිසිදු වෙනසක් සිදු නොවූ බව පෙන්වාදිය හැකිය.



## කෲ-මැකලම් ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ

### පසුබිම

පූර්වයෙන් දක්වන ලද ආකාරයට 1833න් පසු කෝලබෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වීමත් සමගින් ලංකාවේ සමාජ දේහය තුළ ආර්ථික, දේශපාලනික හා සමාජමය යන සෑම අංශයකම පෙර නොවූ විරූ වෙනස්කම් විද්‍යමාන වන්නට විය. දහනව වන සියවස අවසාන වන විට ඉංග්‍රීසීන් විසින් බටහිර අධ්‍යාපන ක්‍රමය ඉදිරිපත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් නීතිඥ වෘත්තියත්, වෛද්‍ය වෘත්තියත් මෙරට ජනතාවට විවෘත විය. එසේම උක්ත ප්‍රතිසංස්කරණ නිසා වතු වගාව ලංකාව තුළ ව්‍යාප්තවී ගිය අතර එයින් ධනවත් වූ පුද්ගලයන්ගේ දූ පුතුන් මෙම වෘත්තීන්ට ඇතුළත් වී ලාංකීය පන්නයේ ධනවාදී පන්තියක් නිර්මාණය කළ අතර එකී පංතිය ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සඳහා පුරෝගාමී වූ බව හඳුනාගත හැකිය.

පවතින පාලන ක්‍රමයට එරෙහිව නව පාලන ප්‍රතිසංස්කරණ ඉල්ලා උද්ඝෝෂණ ව්‍යාපාර වෙත උක්ත පංතිය ඇතුළු වීම සමගින් ජාතිවාදී හැඟීම් ද උත්සන්න වූ බව හඳුනාගත හැකියිමේ යටතේ ජාතිකවාදී ව්‍යාපාරයත් ඊට සමගාමීව කම්කරු පංති ව්‍යාපාරයත් ක්‍රමිකව සංවර්ධනයට ලක්වේ. මේ සංවර්ධනය සඳහා කැපවී සිටි මධ්‍යම පාන්තික නායකයයෝ ස්වකීය ක්‍රියාමාර්ග ඉදිරියට ගෙන යාම සඳහා සංවිධාන කිහිපයක් ද පිහිටුවාගත්හ. එසේ පිහිටුවාගත් සංවිධාන අතරින් ලංකා ජාතික සංගමය, හලාවත සංගමය, යාපනය සංගමය සහ පහතරට වැවිලිකරුවන්ගේ සංගමය කැපී පෙනෙන සංවිධාන විය. මෙම සංවිධාන යටතේ විසිවන සියවසේ මුල් දශකයේ සිට මධ්‍යම පාන්තික නායකයෝ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සඳහා උද්ඝෝෂණය කරමින් සිටියහ.

ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් සමාජික සංඛ්‍යාව වැඩිකොට ජාතිමූල නියෝජනය වෙනුවට ප්‍රදේශ මූල නියෝජනයක් ඇතිකිරීම, ව්‍යවස්ථාදායක සභාවට ව්‍යවස්ථා කෙටුම්පත් ආරම්භ කිරීමේ බලය ලබාගැනීම, එකී සභාවේ

සාමාජිකයන්ට ස්වකීය කැමැත්ත පරිදි ඡන්දය දීමේ නිදහස ලබාගැනීම, විධායක සභාවට නිලනොලත් සාමාජිකයන් කිහිප දෙනෙකු පත්කර ගැනීම සහ ව්‍යවස්ථාදායකයේ සභාපති තනතුරට ආණ්ඩුකාරයා වෙනුවට මෙරට විජිත ලේකම්වරයා පත්කරගැනීම යන මේවා උද්ඝෝෂකයන්ගේ මූලික ඉල්ලීම් විය. මුළු රටටම පොදු ඉල්ලීම් මාලාවක් ඇතුළත් කොට 1908 දී ජේම්ස් පීරිස් මහතා විසින් ඉදිරිපත් කරන ලද සන්දේශය මේ අතර ඉතා වැදගත්වේ.

එතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපියේ අඩංගු වූයේ ව්‍යවස්ථාදායක මණ්ඩලයට, මෙරටට අවශ්‍ය වනසේ වහාම ඉදිරිපත් කළයුතු ප්‍රතිසංස්කරණ දෙකකි. එනම්

1. වාර්ගික නියෝජන ක්‍රමය අහෝසි කිරීම.
2. නාමකරණයෙන් මන්ත්‍රීවරු පත්කිරීම වෙනුවට ඡන්දයෙන් පත්කිරීම.[14]

යන යෝජනා දෙකයි.මෙලෙස මෙරට උගත් මධ්‍යම පාන්තිකයන් ගෙනගිය ඉල්ලීම් පිළිබඳව එවකට ලංකා ආණ්ඩුකාරවරයාව සිටි හෙන්රි මැකලම් (1907-1913) එතරම් සැලකිල්ලක් නොදැක්වූවත් ඒ පිළිබඳව සොයා බැලීම සඳහා යටත් විජිත ලේකම් කෲ මහතා එකඟ විය. එම සොයා බැලීමට අනුව දෙවන වරට ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඇතිවීම සඳහා පසුබිම නිර්මාණය විය.

## කෲ-මැකලම් ප්‍රතිසංස්කරණයන්හි ව්‍යුහය සහ ප්‍රතිඵල

කෲ-මැකලම් ආණ්ඩු ක්‍රමය වනාහි ඉල්ලීම් කොට දිනාගන්නා ලද ප්‍රථම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය ලෙස හඳුනාගත හැකිය. 1910 දී පමණ ඉදිරිපත් වූ මෙම ප්‍රතිසංස්කරණ නිසා ව්‍යවස්ථාදායක සභාව මන්ත්‍රීවරු විසි එකක් දක්වා වර්ධනය විය. ඔවුන්ගෙන් එකොළොස් දෙනෙක් පමණ නිල ලත් මන්ත්‍රීවරුන් වූ අතර ඉතිරි දස දෙනා නිල නොලත් මන්ත්‍රී ගණයට ඇතුළු විය. මෙම නිල නොලත් මන්ත්‍රීවරුන් දස දෙනාගෙන් හය දෙනෙකු ආණ්ඩුකාරතුමා විසින් පත්කරන ලද අතර හත්



දෙනෙකු ඡන්දයෙන් තෝරා පත්කරගන්නා ලදී. ආණ්ඩුකාරතුමා විසින් පත්කරන ලද අයගෙන් දෙදෙනෙක් පහතරට සිංහලයෝය. එක් අයෙක් උඩ රට සිංහලය. දෙදෙනෙක් ද්‍රවිඩ ජාතිකන් වූ අතර එක් අයෙකු මුස්ලිම් ජාතිකයෙකු වීය. ජාතීන් අනුව මන්ත්‍රීන් තෝරා පත්කර ගැන්මේ ක්‍රමය මේ ප්‍රතිසංස්කරණ සමගින් ස්ථාවර තත්ත්වයකට පත්වූ බව හඳුනාගත හැකිය. ඡන්දයෙන් තේරී පත්වන හතර දෙනාට ද පොදු වූයේ ජාතිමූල නියෝජන ක්‍රමයයි. නාගරික යුරෝපීයන් සඳහා එක් අසුනක් ද ගම්බද යුරෝපීයන් සඳහා එක් අසුනක් ද බර්ගර් ජාතිකයන් සහ ලාංකිකයන් සඳහා ආසන එක බැගින් ද වෙන් වී තිබුණේය. මෙලෙසින් ප්‍රතිසංස්කරණයට ලක්කරණ ලද ආණ්ඩු ක්‍රමය 1912 සිට ක්‍රියාත්මක

1912 ව්‍යවස්ථාදායක සභාව

සාමාජිකයන් - 21

- නිල ලත්- 11
- නිල නොලත්-10
  - නම් කිරීමෙන්-06
    - පහත රට සිංහල - 02
    - දෙමළ - 02
    - උඩරට සිංහල - 01
    - මුස්ලිම් - 01[15]
  - සීමිත ඡන්දයෙන් - 04
    - යුරෝපීය - 02
    - බර්ගර් - 01
    - ලාංකික - 01

කෙසේ වෙතත් මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය හරහා ආණ්ඩුකාරවරයාගේ බලතල හෝ විධායක සභාවේ බලතලවල කිසිදු වෙනසක් සිදු නොවීය. එහෙත් මෙකී ආණ්ඩු ක්‍රමය ආරම්භ වූ සමයේ ක්‍රියාත්මක වූ වැදගත් අංගයක් ලෙස මුදල් පිළිබඳ කාරක සභාව හඳුනාගත හැකිය. මෙම කාරක සභාවේ සංයුතිය වූයේ විජිත ලේකම්, විජිත භාණ්ඩාගාරික, ආදායම් පාලක තුමා සහ සියලුම නිල නොලත් මන්ත්‍රීවරුය. මෙය

පිහිටුවනු ලැබුවේ ව්‍යවස්ථාදායක සභාවේ රැස්වීම් නොපවත්වන අවස්ථාවල ආණ්ඩුවේ මුදල් සම්බන්ධ යෝජනා පරීක්ෂාකර බැලීමට නිල නොලත් සභිකයන්ට අවස්ථාව ලබා දීමටය. මේ ක්‍රමය නිසා නිල නොලත් මන්ත්‍රීවරුන්ටපාලන කටයුතුවලට සහභාගීවීමට අවස්ථාව ලැබුණු අතර ආණ්ඩුවේ යෝජනා සම්බන්ධයෙන් නිල නොලත් සභිකයන්ගේ අදහස් දැනගැනීමට ආණ්ඩුවට හැකිවිය. සීමිත ඡන්ද බලය හඳුන්වා දෙන ලද මෙම ප්‍රතිසංස්කරණයන් තුළින් සිදු වූ තවත් වැදගත් කරුණක් වූයේ සීමිත ඡන්දයෙන් ලාංකික නියෝජිතයා ලෙස පොන්නම්බලම් රාමනාදන් මහතා ව්‍යවස්ථාදායක සභාවට පත්වීමයි

මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය හරහා වාර්ගික ජන නියෝජන ක්‍රමය ක්‍රියාත්මක වීම හේතුවෙන් පහතරට සිංහලයන් අතර අප්‍රකාශිත භේදයන් ආරම්භ විය. එයට ප්‍රධානම හේතුව වූයේ ආණ්ඩුකාරවරයා විසින් පහත රට සිංහලයන් වෙනුවෙන් පත්කළ අයගෙන් එක් අයෙක් ගොවි කුලයෙන් ද අනෙකා කරාව කුලයෙන් ද පත් කිරීමයි.[16] තමන්ට පැවරී තිබූ බලතල අනුව මැකලම් ආණ්ඩුකාරවරයාගේ ප්‍රතිපත්තිය වූයේ ජන නායකයින් වශයෙන් දේශීය ප්‍රභූන් සහ අලුතෙන් ධනවත් වූ බලවතුන් පත්කර ගැනීමයි.

කෲ-මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය ලාංකිකයන් විසින් ඉල්ලීම් කොට දිනාගනු ලැබූ ප්‍රථම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය වුව ද ලාංකේය අවශ්‍යතා ඒ හරහා ඉටු වූයේ ඉතා අල්ප වශයෙන් බව පූර්ව තොරතුරු දැක්වීමෙන් තහවුරු වේ. එනිසා මෙකී ප්‍රතිසංස්කරණයෙන් ලාංකිකයන් සෑහීමකට පත්නොවූ බව පසුකාලීන ක්‍රියාවලින් තුළින් මැනවින් පැහැදිලිවේ.

## මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

### පසුබිම

කෲ-මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හරහා ස්වකීය අපේක්ෂා ඉටු නොවන බව දුටු ලාංකීය මධ්‍යම පාංතිකයෝ තවදුරටත් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ලබාදෙන ලෙස ඉල්ලමින්



විවිධ ක්‍රියාවලීන්හි නිරත වූහ.කෲ-මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය දක්වා ආණ්ඩුක්‍රම සංශෝධන ව්‍යාපාරයේ ප්‍රමුඛත්වය ගනු ලැබුවේ බටහිර අධ්‍යාපනය ලබා එම සංස්කෘතියට සහ ජීවන රටාවට ඇබ්බැහි වී සිටි මධ්‍යම පාංතිකයන්ය. බොහෝ විට ක්‍රිස්තියානුවන් වූ ඔවුහු ලංකාවට විශාල සේවයක් සිදුකොට ඇති බ්‍රිතාන්‍ය පාලනය තවදුරටත් අවශ්‍ය බවත් දේශීය සමාජය ස්වයං පාලනයට සුදුසු නැති බවත් එයට විරුද්ධව සටන් කිරීම අනවශ්‍ය බවත් කල්පනා කළහ. එසේම සමකාලීන බෞද්ධ පුනර්ජීවනය හේතුකොටගෙන ජනිත වූ ජාතිවාත්සල්‍යයට එතරම් කැමැත්තක් නොදක් වූ ඔවුහු පොදුජනයා දේශපාලන ව්‍යාපාරවලින් ඉවත්කොට තැබීමට උත්සාහ කළහ. මේ නිසා විසිවන ශතවර්ෂය ආරම්භ වන තෙක්ම ලංකාවේ පැවති දේශපාලන උද්ඝෝෂණ පුළුල් ජාතික ව්‍යාපාර බවට පත් නොවීය.

මේ අතර ලංකාවට පැමිණි ඇතැම් සිවිල් නිලධාරීන් මෙරට ශිෂ්ටාචාරය පිළිබඳව කළ අධ්‍යයන හේතුකොට ගෙන දේශීය සංස්කෘතිය සම්බන්ධයෙන් මධ්‍යම පාංතිකයන් තුළ තිබූ ආකල්ප වෙනස් වෙමින් පැවතුණි. එඩ්වඩ් අප්හැම් මහාවංශය, රත්නාකරය, රාජාවලිය, ඉංග්‍රීසියට පරිවර්තනය කළ අතර ජෝර්ජ් ටර්නර් මහාවංශය නිවැරදිව ඉංග්‍රීසියට පරිවර්තනය කළේය. විලියම් ජී. ග්‍රෙගරි ආණ්ඩුකාරවරයාගේ සමයේ ඔහුගේ නියෝග මත මෙරට පුරාවිද්‍යා පරීක්ෂණ සිදුකිරීම ආරම්භ වූ අතර 1881 දී එඩ්වඩ් මුලර් ලංකාවේ පැරණි සෙල් ලිපි නම් ග්‍රන්ථය රචනා කළේය. දහනව වන සියවස අවසාන දශකයේදී එච්. සී. පී. බෙල් මහතා උතුරු මැද පළාතේ හා කෑගලු දිස්ත්‍රික්කයේ නෂ්ටාවශේෂ පිළිබඳව ගවේෂණයක් ආරම්භ කළේය. මෙකී කාරණාවන් හේතුවෙන් අනාවරණිත තත්ත්වයන් ලාංකේය මධ්‍යම පංතිය තුළ මහත් අභිමානයක් ඇතිකිරීමට සමත් විය. මේ අතර ජපානය අභිනව බලසම්පන්න රාජ්‍යයක් ලෙස 1894 දී බ්‍රිතාන්‍යය විසින් පිළගනු ලැබීමත් ප්‍රබලතම යුරෝපා රාජ්‍යයක් ලෙස පිළිගත් රුසියාව 1905 දී ජපානය විසින් පරාජයට පත්කරනු ලැබීමත් නිසා එතෙක් බටහිර ජාතීන් අතිශ්‍රේෂ්ඨ යැයි මුල්බැසගෙන තිබූ මතය වෙනස්වීමට හේතු විය.

1911 න් පසු බ්‍රිතාන්‍ය රජය සිය ආදායම් වැඩිකර ගැනීම අරමුණු කරගනිමින් ලංකාවේ සෑම පළාතකම තැබෑරුම් විවෘත කිරීමට තීරණය කිරීම නිසා ඇතිවූ සමාජ අසහනය හා භීතිය හේතුකොට ගෙන ගැමි සමාජයේ ක්‍රමකව බිහිවූ අමද්‍යප සංවිධාන ප්‍රාණවත්ව නැගී සිටි අතර උගත් ධනවත් පංතිය ද රජයේ තැබෑරුම් ප්‍රතිපත්තියට විරුද්ධව උද්ඝෝෂණ ආරම්භ කළහ. මෙසේ බිහි වූ අමද්‍යප ව්‍යාපාරයට එෆ්. ආර්. සේනානායක, ඩී. එස්. සේනානායක, ඩී. බී. ජයතිලක, එඩ්මන් හේවාවිතාරණ, වෛද්‍ය සී. ඒ. හේවාවිතරණ, අනගාරික ධර්මපාල, පියදාස සිරිසේන, ඩබ්ලියු. ඒ. සිලවා, අමදෝරිස් මැන්දිස්, පී. එච්. ඒබ්‍රහම් ද සිල්වා සහ ආතර් වී. දියෙස් වැනි බෞද්ධ නායකයින් ද එකතු වීම නිසා ඒකාබද්ධ වූත් මනාව සංවිධානය වූත් අමද්‍යප ව්‍යාපාරයක් බිහිවිය. මෙම නායකයෝ මෙරට සුප්‍රකට මහ තෙරවරුන් ද සහභාගී කරගෙන රට පුරා රැස්වීම් පවත්වා මත්පැන් පානයේ ආදීනව කියාපෑමෙන් තැබෑරුම් වර්ජනය කිරීමටත් රජයේ ප්‍රතිපත්ති පුළුල් ලෙස විවේචනය කිරීමටත් පටන් ගත්හ. 1915 පමණ වනවිට මෙම අමද්‍යප ව්‍යාපාරය සිංහල බෞද්ධ ජාතික ව්‍යාපාරයක් බවට පත්ව තිබුණි. මෙකී ව්‍යාපාරය දේශපාලනික වශයෙන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සඳහා යොදාගැනීමට මෙම නායකයන් තුළ අපේක්ෂාවක් පැවතිය ද බෞද්ධාගමික පදනමක් මත දේශපාලන ව්‍යාපාරයක් බිහිවීම කෙරෙහි මුල සිටම විරුද්ධත්වයක් දක් වූ ක්‍රිස්තියානි සහ සිංහල නොවූ නායකයෝ ඊට විරෝධය දක්වූහ.

## 1915 සිංහල මුස්ලිම්-කෝලාහලය

1912 මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වූ සමයට ආසන්නව අමද්‍යප ව්‍යාපාරය හරහා නව සංවිධානාත්මක ව්‍යුහයක් යටතේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉල්ලා උද්ඝෝෂණ ක්‍රියාත්මක වෙද්දී එකී ප්‍රතිසංස්කරණවලට බලපෑම් කරණ ලද සුවිශේෂී සිදුවීමක් 1915 දී සිදුවිය. ඒ සිංහල-මුස්ලිම් කෝලාහලයයි. දහනව වන සියවසේ දෙවන භාගයේ පටන් උත්සන්න වූ බෞද්ධ පුනරුද ජාතික හැගීම් මේ සඳහා



ප්‍රමුඛව ඉවහල් විය. 1915 වන විට පූර්ණ වශයෙන් ලංකාව බ්‍රිතාන්‍යයන්ට යටත්වී සියවසක් සපිරීම නිමිත්තෙන් විවිධ උත්සව ද සංවිධානය කොට තිබුණි. එසේම බ්‍රිතාන්‍ය, ජර්මනිය සමඟ යුද්ධයක ද පැටලී තිබුණි (1914-1918).[17]

මෙබඳු වාතාවරණයක් යටතේ සිංහල-මුස්ලිම් කෝලාහලය ඇතිවීමට හේතුවූයේ ගම්පොළ වලහගොඩ දේවාලයේ වාර්ෂික පෙරහැර හා සම්බන්ධ වූ සිද්ධියකි. මෙම පෙරහැර පැවැත්මට අවසරදීමේ දී ගම්පොළ තිබූ මුස්ලිම් පල්ලිය ඉදිරිපිටින් ගමන්කරන විට යාර 100 ක් ඇතුළත බෙර හා තූර්ය භාණ්ඩ වාදනය කිරීමත් නැටුම් ගැයුම් පැවැත්වීමත් තහනම්කොට නියෝගයක් පනවා තිබුණි. එම නියෝගය නීත්‍යනුකූල නොවන බවට දිස්ත්‍රික් උසාවියෙන් ප්‍රකාශ කළ නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය එම නියෝගය අවලංගු කර මුල් නියෝගය වලංගු කරන ලදී. එහෙත් එම තහනම් නියෝගය නොතැකූ බෞද්ධ ජනතාව පාරම්පරිකව පැවත ආ ආකාරයට පෙරහැර පැවැත්වූහ. එම අවස්ථාවේ මුස්ලිම් පල්ලිය අසළදී පෙරහැරට බාධා ඇතිවී ප්‍රබල ගැටුමක් හටගත්තේය. මෙම ගැටුම ලංකාව පුරා ව්‍යාප්ත වූ අතර මෙය බ්‍රිතාන්‍යයන් ලංකාවෙන් පන්නා දැමීම සඳහා කරන ලද අරගලයක් ලෙසට බ්‍රිතාන්‍යයන් වරදවා තේරුම් ගත් නිසා එවක ආණ්ඩුකාරවරයා වූ රොබට් චාමස් (1913-1916) කෝලාහලය මැඩලීමට යුධ නීතිය (marshal low) පැනවීය. ඒ යටතේ ජාතික පුනරුද ව්‍යාපාරවල සහ අමද්‍යප ව්‍යාපාරවල පෙරමුණ ගත් එෆ්. ආර්. සේනානායක, ඩී. එස්. සේනානායක,ඩී. බී. ජයතිලක, සී. ඒ. හේවාවිතාරණ, සී. බටුවන්තුඩාව, ඒ. ඊ. ගුණසිංහ වැනි ජාතික නායකයන් අත් අඩංගුවට ගත්තේය. එහෙත් ඔවුන්ට විරුද්ධව රාජද්‍රෝහී චෝදනා ඔප්පුකරන්නට සාක්ෂි නොවූයෙන් මාස තුනකට පසුව නිදහස් කළේය. ඊට අමතරව විලියම් පේදිරිස් ඇතුළු සිංහල තරුණයන් කිහිපදෙනෙකු කිසිදු වග විභාගයකින් තොරව වෙඩිතබා ඝාතනය කර දැමීය.

## ලංකා ජාතික සංගමය පිහිටුවීම හා ක්‍රියාත්මක වීම

පූර්වයෙන් සඳහන් කරනලද 1915 දී ඇති වූ කෝලාහලය ඉතා නිර්දය ආකාරයෙන් බ්‍රිතාන්‍යයන් මර්දනය කිරීම හේතුවෙන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය නව මාවත් කරා පියමැන්නේය. 1915ට පෙරවෙන් වෙන්ව ප්‍රතිසංස්කරණ ඉල්ලමින් සිටි නායකයින්, සියලු දෙනාගේ එක්සත්කමක් ඇතිවිය යුතු බව වටහාගත්හ.මෙම එක්සත්කම ඇතිකිරීම සඳහා මූලිකත්වය ගනු ලැබුවේ පොන්නම්බලම් අරුණාචලම් මහතාය. ඒ අනුව 1917 දෙසැම්බර් 11 වන දින ලංකා ප්‍රතිසංස්කරණ සංගමය පිහිටුවා ගත්තේය. ලංකාවේ ප්‍රතිසංස්කරණ උද්ඝෝෂණ ව්‍යාපාරය සාර්ථක කරගෙන රටට නිදහස ලබාගැනීමටනම් ඒකාබද්ධ මණ්ඩලයක අවශ්‍යතාවය දුටු අරුණාචලම් මහතා 1919 දෙසැම්බරයේදී නිදහස් ව්‍යාපාරය දියත් කිරීමට ඒකීය සංවිධානයක් යෝජනා කළේය. ලංකාවේ මහජන මතය සහ දේශපාලන අදහස් එකතුකිරීම මෙහි මූලික පරමාර්ථය විය. එම පරමාර්ථය මල් පල දරමින් 1919 දෙසැම්බර් 11 වන දින ලංකා ජාතික සංගමය පිහිටුවාලීය. මීට සමාන්තරව ගාන්ධිතුමාගේ නායකත්වයෙන් ඉන්දියාවේ ක්‍රියාත්මක වූ ජාතික සංගමය මහජන බලවේගයක් ලෙස ක්‍රියාත්මක වුවද ලංකා ජාතික සංගමය කොන්සර්වැටිව් සහ ව්‍යවස්ථානුකූල මතවාදීන්ගේ අදහස් අනුව ක්‍රියාත්මක වූ සංවිධානයක් විය.

ඩී. එස්. සේනානායක, එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක, ඒ. ඊ. ගුණසිංහ, ජේ. ආර්. ජයවර්ධන වැනි පසුකාලීන දේශපාලන නායකයන් නිර්මාණය කිරීමේ වේදිකාව වූයේ මෙම ලංකා ජාතික සංගමයයි. මෙම සංවිධානයේ මුල්ම සභාපතිවරයා වූ පොන්නම්බලම් අරුණාචලම් මහතා යටතේ සංගමයේ නියෝජිතයින් පිරිසක් 1920 දී එංගලන්තයට ගොස් ඇල්ෆඩ් මිලිනර් හමුවී ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යෝජනා මාලාවක් ඉදිරිපත් කළේය. එම යෝජනා අතර ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් සාමාජික සංඛ්‍යාව 50 දක්වා වැඩිකිරීම, එහි සභාපති ධූරයට එම සාමාජිකයන් අතරින් කෙනෙකුම පත්කර ගැනීම, ජාති මූල නියෝජනය ඉවත්කොට ප්‍රදේශ මූල ක්‍රමය




ඇතිකිරීම, විධායක සභාවට ලාංකිකයන් දෙදෙනෙකු පත්කොට ව්‍යවස්ථාදායක හා විධායක සභා අතර සම්බන්ධයක් ඇති කිරීම, ආදී යෝජනා ප්‍රමුඛ විය. මෙකී යෝජනාවලට විරුද්ධත්වය පල කළ එවකට ලංකා ආණ්ඩුකාරවර විලියම් එච්. මැනිං (1918-1925) ලංකා ජාතික සංගමය මගින් ජාතික නියෝජනයක් නොපෙන්වන බව යටත් විජිත කාර්යාලයට පෙන්වා දුන්නේය. කෙසේවෙතත් ජාතික සංගමය ගෙන ගිය ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය නොදුටුවාසේ සිටීමට බ්‍රිතාන්‍යන්ට නොහැකි විය. ඒ අනුව 1920 දී නව ප්‍රතිසංස්කරණ යෝජනාවලියක් ඉදිරිපත් විය.

## මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ ව්‍යුහය සහ ප්‍රතිඵල

මෙම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ ප්‍රධාන ලක්ෂණය වූයේ ව්‍යවස්ථාදායක සභාවේ සාමාජික සංඛ්‍යාව 37 දක්වා වැඩිකිරීමයි. ඉන් 14 දෙනෙකු නිල ලත් අය වූ අතර ඡන්දයෙන් 16 දෙනෙකු පත්කර ගැනීමේ බලය ලාංකිකයන්ට හිමිවිය. 11 දෙනෙකු ප්‍රදේශ මූල ඡන්දයෙන් තෝරා පත්කර ගැනීමට ද තීරණය විය. මෙකී යෝජනා අනුව 1921 ඡන්දයක් පවත්වා නව නියෝජිතයන් තෝරා පත්කර ගැනීමෙන් අනතුරුව මෙම ප්‍රතිසංස්කරණ යෝජනාවලිය ක්‍රියාත්මක විය.

1921 ව්‍යයස්ථාදායක සභාව




1921 පවත්වන ලද ඡන්දයෙන් මෙකී සභාවට සිංහල නියෝජිතයන් 13 සහ ද්‍රවිඩ නියෝජිතයන් 03 දෙනෙක් තේරී පත්විය. ද්‍රවිඩ නියෝජිතයෝ මේ පිළිබඳව සෑහීමකට පත්නොවූ අතර බස්නාහිර පළාතෙන් තමුන්ට අසුනක් ලබාදෙන ලෙස ඉල්ලා සිටියහ. ඒ සඳහා ලංකා ජාතික සංගමයේ සහය නොලැබෙන්නේ නම් තමන් එම සංගමයෙන් ඉවත් වන බව කියා සිටි ද්‍රවිඩ නියෝජිතයෝ 1921 අගෝස්තු මස 15 වන දින සමස්ත ලංකා ද්‍රවිඩ මහජන සභාව පිහිටුවා ගත්හ. ලංකාව තුළ භේද ඇතිකිරීමට මෙය කදිම අවස්ථාවක් කරගත් මැනිං ආණ්ඩුකාරයා, සුළු ජාතික ඉල්ලීම් කෙරෙහි වඩා රුකුල් ලබා දුනතේය. මේ අනුව ජාතිභේදයේ ස්වරූපයන් ප්‍රථම වතාවට ඇතිකරවන ලද්දේ මැනිං ප්‍රතිසංස්කරණ විසින් බව හඳුනාගත හැකිය. පොන්නම්බලම් අරුණාචලම් මහතා ජාතික සංගමයෙන් ඉවත් වූ පසු එහි සභාපති වූ එච්. ජේ. සී. පෙරේරාණී මැනිං ප්‍රතිසංස්කරණ දැඩිව විවේචනය කළේය. ලංකා ජාතික සංගමය නව ව්‍යවස්ථාදායක සභාව වර්ජනය කිරීමට යෝජනා කළේය.එහෙත් ජේම්ස් පීරිස්, පොන්නම්බලම් රාමනාදන්, මාකස් ප්‍රනාන්දු යන නායකයෝ මැනිං ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කළ යුතු බව කියා සිටියහ. ආනාගත ප්‍රතිසංස්කරණ ලැබෙන්නේ මෙය ක්‍රියාත්මක කිරීමෙන් පසුව බව ඔවුන් පෙන්වා දීමෙන් පසුව ජාතික සංගමය එයට එකඟ වීය. කෙසේ වුව ද ද්‍රවිඩ මහජන සභාවේ සහ ලංකා ජාතික සංගමයේ ප්‍රතිසංස්කරණ




ඉල්ලීම් වල ප්‍රතිඵලයක් වශයෙන් 1924 දී තවත් ප්‍රතිසංස්කරණයක් මෙරටට ලැබුණි.

## මැනිං-ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණ සහ එහි ව්‍යුහාත්මක පසුබිම

මැනිං ආණ්ඩුකාරවරයාගේ යෝජනාවන්ට අනුව 1924 දී ලැබුණු මෙම ප්‍රතිසංස්කරණ ආණ්ඩුකාරයාගේ හා යටත් විජිත ලේකම් ඩෙවොන්ෂයර්ගේ නමින් මැනිං-ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණ ලෙස හැඳින්වේ. එහි සංයුතිය මෙසේය

1924 ව්‍යවස්ථාදායක සභාව




ව්‍යස්ථාදායකයේ බහුතරය නිල නොලත් අයවීමත් ආණ්ඩුකාරයාට අමතර එහි සාමාජිකයන් විසින් පත්කෙරුණු උප සභාපතිවරයෙකු සිටීමත් විධායක සභාවට නිලනොලත් සාමාජිකයන් කිහිපදෙනෙකු පත්කිරීමත් මෙම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණය වේ. කෙසේ වෙතත් ආණ්ඩුකාරයා සතු බලතල වල කිසිදු වෙනසක් මෙම ප්‍රතිසංස්කරණවලින් ඇති නොවුණි. ප්‍රදේශමූල ඡන්ද ක්‍රමයේ යම් කිසි ව්‍යාප්තියක් ඇති වුව ද ඡන්ද බලය හිමි වූයේ ඉංග්‍රීසි භාෂාවට අමතරව සිංහල හෝ දෙමළ කථාකළ හැකි, වයස අවුරුදු විසි එකට වඩා වැඩි පිරිමින්ට පමණි. ඔවුන්ට වර්ෂයකට රුපියල් හයසීයකට නොඅඩු ආදායමක් හෝ රුපියල් එක්දහස් අටසීයකට නො අඩු වටිනාකමකින් යුත් දේපලක් තිබීම හෝ රුපියල් හාරසීයකට නො අඩු නාගරික නිවාසයක හෝ වාර්ෂික

කුලිය රුපියල් දෙසීයකට නො අඩු ග්‍රාමීය නිවසක පදිංචිකරුවෙකු වීම හෝ අත්‍යවශ්‍ය විය. ඒ අනුව මෙරට ඡන්ද බලය හිමි වූයේ 4% කට පමණි.

කෙසේ වෙතත් මෙමගිනුත් ලාංකේය ඉල්ලීම් සම්පූර්ණ කිරීමට නොහැකිවූ බැවින් ලංකා ජාතික සංගමය කොටස් වලට බෙදී තිබුන ද එසේ බෙදී ගිය සංවිධාන මගින් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සඳහා කරණ ලද බලපෑම් දිගටම කරගෙන ගියේයි

## ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ

මෙරට ජාතික නායකයින් ගෙනගිය උද්ඝෝෂණ සහ හියුක්ලිෆඩ් ආණ්ඩුකාරවරයාගේ (1925-1927) නිර්දේශ සැලකිල්ලට ගත් බ්‍රිතාන්‍ය රජය, ලංකාවට සුදුසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක් පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීමට 1927 දී කොමිසමක් එවීය. එම කොමිසම ඩොනමෝර් සාමිගේ නායකත්වය යටතේ ජෙෆ්රි බට්ලර්, මැතිව් නේතන් සහ ඩ්‍රමන්ඩ් යන තවත් සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය. මෙම පිරිස මාස දෙකක් පමණ කාලයක් නොයෙක් සංවිධාන වලින් සහ පුද්ගලයන්ගෙන් කරුණු විමසා පවතින ආණ්ඩු ක්‍රමය විශ්ලේෂණය කළ කොමිසම තම වාර්තාව 1930 ජුලි මස ප්‍රකාශයට පත් කළේය. එහිදී කොමිසම තම විෂයක්ෂේත්‍රය පිළිබඳව මෙසේ ප්‍රකශ කළේය. ඒ ''ලංකාවේ පවත්නා වූ ආණ්ඩු ක්‍රමය ක්‍රියාවේ යෙදෙන අන්දම හා එයින් පැන නැගී ඇති යම් දුෂ්කරතා ඇතොත් ඒවා පිළිබඳව වාර්තාවක් සැපයීමටත්, ආණ්ඩු ක්‍රමය සංශෝධනය කිරීම සදහා කිසියම් යෝජනාවක් ඉදිරිපත් කෙරුණේ නම් ඒවා සලකා බැලීමටත් දූනට සම්මතයෙහි පවත්නා පනතෙහි සංශෝධන කළ යුතු තැන් ඇතොත් ඒවා පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීමටත්ය.''[20] යනුවෙනි.

උක්ත අරමුණුවලින් යුක්තව ඩොනමෝර් කොමිසම විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව 1931 සිට ක්‍රියාත්මක විය. 1833 සිට 1931 දක්වා සියවසක කාලයක් පුරාවට මන්දගාමීව පැවති



ආණ්ඩුක්‍රම විකාසනයේ නව පෙරළියක් ඩොනමෝර් ප්‍රතිසංස්කරණ නිසා ඇතිවිය. සර්වජන ඡන්ද බලය ලබාදීම, රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම, විධායක කාරක සභා ක්‍රමය හඳුන්වාදීම, අනාගත කැබිනට් ක්‍රමයකට මෙරට දේශපාලනඥයන් හුරුකිරීම, ආදිය ඩොනමෝර් කොමිසම විසින් ප්‍රකාශිත වර්ධනීය අංගයන් ලෙස පෙන්වාදිය හැකිය. ඩොනමෝර් ක්‍රමයේ යම් යම් දුර්වලතා පැවතිය ද සියවසකට ආසන්න කාලයක් එක තැන පල්වීගිය ආණ්ඩුක්‍රමයකින් බැහැරව දේශපාලන ක්ෂේත්‍රයේ පුළුල් වෙනසකට මෙමගින් අඩිතාලම දූමීය.

1833 ව්‍යවස්ථාදායක සභා පිහිටුවීමේ සිට දක්නට ලැබුණු ආණ්ඩු ක්‍රමයේ මූලික දුර්වලතාවක් වූ ජාතිමූල නියෝජන ක්‍රමය අහෝසි කළ ඩොනමෝර් කොමිසම ඒ වෙනුවට සර්වජන ඡන්ද බලය ස්ථාපිත කිරීම මෙරටට අතිශය ඵලදායී ප්‍රතිඵල ගෙනදීම සදහා ඉවහල් වූ බව පසුකාලීන දේශපාලන ක්ෂේත්‍රය විග්‍රහ කරන කල්හි පෙනී යයි. 1931 ට පෙර ලංකා ආණ්ඩුක්‍රමය නමැති ශරීරයේ හටගත් පිළිකාවක් ලෙස හඳුන්වාදිය යුතු වූ ජාතිමූල නියෝජනය අද ශ්‍රී ලංකාව මුහුණ දී ඇති ජනවාර්ගික අර්බුදයේ මූලබීජය බව අමුතුවෙන් විග්‍රහ කළ යුතු නොවේ.

1931 සර්වජන ඡන්ද බලය ලැබීම, විශේෂයෙන් ද්‍රවිඩ නායකයන් තුළ අප්‍රසාදය වඩවන කාරණයක් විය. එයට හේතු වූයේ ජාති මූල නියෝජන ක්‍රමය අහෝසි කිරීම නිසා තම වාර්ගික නියෝජනය අඩුවීමයි. සිංහල මන්ත්‍රීවරුන් 50ක් සිටින ව්‍යවස්ථාදායක සභාවක දෙමළ මන්ත්‍රීවරුන් 25ක් සිටිය යුතු බවට ඩොනමෝර් කොමිසම ඉදිරියේ සාක්ෂි දුන් යාපනයේ ද්‍රවිඩ නායකයෙකු වූ ශ්‍රී පද්මනාග මහතා පවසා තිබේ. මෙබඳු ඉල්ලීම් පිළිබඳව බ්‍රිතාන්‍ය පාලකයන් සැලකිල්ලක් නොදක්වීම නිසා කොමිසමේ නිර්දේශවලට විරුද්ධත්වයක් පලකිරීමක් වශයෙන් ද්‍රවිඩ නායකයෝ 1931 මැතිවරණයේදී යාපනය ප්‍රදේශය සඳහා වෙන් කරන ලද ආසන හතරට තරග කිරීම ද වර්ජනය කළහ.

ඩොනමෝර් කොමිසම සිය හැදෑරීම් වලින් අනතුරුව වයස අවුරුදු 21කට නොඅඩු පිරිමින්ටත් වයස අවුරුදු 31ට නො අඩු

ස්ත්‍රීන්ටත් ඡන්ද බලය දිය යුතු යැයි යෝජනා කරන ලදී. ඒ අනුව ස්ත්‍රී-පුරුෂ වශයෙන් අයිතිවාසිකම් වල වෙනසක් වයස අනුව දක්නට ලැබුනද ඩොනමෝර් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී වයස අවුරුදු විසිදෙකට නො අඩු සෑම අයෙකුටම ඡන්ද බලය හිමි විය. එපමණක්ම නොවේඡන්ද බලය පිරිනැමීමේදී දේපල හා අධ්‍යාපන සුදුසුකම් බාධාවක් නොවිය යුතු බව පැහැදිලිවම දක්වා තිබේ. මෙකී නියමයන්ට යටත්ව 1931 දී ලංකාවේ සිංහල ජාතිකයන් ලක්ෂ තිහකට හා ද්‍රවිඩ ජාතිකයන් ලක්ෂ පහකට ඡන්ද බලය හිමිවිය.

ඩොනමෝර් කොමිසම මෙරට ආණ්ඩුක්‍රමය පිළිබඳව කරන ලද විශ්ලේෂණයන්ගෙන් හඳුනාගන්නා එක් ප්‍රධාන දුර්වලතවක් වූයේ ව්‍යවස්ථාදායකය හා විධායකය යන අංශවල සතුටුදායක සම්බන්ධතාවක් නොපැවතීමයි. මෙම දුර්වලතාව මගහරවා ගැනීම සඳහා ව්‍යවස්ථාදායක හා විධායක බලතල හිමි රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවන ලදී. එසේ පිහිටුවන ලද රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සම්පූර්ණ සාමාජික සංක්‍යාව 61 ක් විය. මෙම සාමාජිකයන්ගෙන් 50 දෙනෙකු පළාත් අනුව සර්වජන ඡන්ද බලයෙන් පත් කරගත් අතර 08 දෙනෙක් ආණ්ඩුකාරවරයා විසින් පත්කරනු ලැබීය. ඉතිරි තිදෙනා මහ ලේකම්, මුදල් ලේකම් හා නීති ලේකම් යන රාජ්‍ය නිලධාරීන් වූහ. මේ තිදෙනාට රජයේ ඉතාම වැදගත් විධායක අංශ තුනක් පැවරුණු අතර සෙසු විධායක අංශ සඳහා සභාවේ කථා නායකවරයාත් රාජ්‍ය නිලධාරීනුත් හැර ඉතිරි සංඛ්‍යාව කණ්ඩායම් හතකට බෙදීමෙන් විධායක කාරක සභාව ස්ථාපිත කෙරුණි.[21]

මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ දෙවතාවක් විධායක කාරක සභා ක්‍රියාත්මක විය. 1931 ඡන්දයෙන් පසු ප්‍රථම විධායක් කාරක සභාව ද 1936 ඡන්දයෙන් පසු දෙවන විධායක සභාව ද ක්‍රියාත්මක විය. මෙසේ පත් වූ විධායක කාරක සභා කොටස් හතකින් යුක්ත විය. ඒ ස්වදේශ කටයුතු, කෘෂිකර්ම කටයුතු, පළාත් පාලන කටයුතු, සෞඛ්‍ය කටයුතු, කම්කරු කර්මාන්ත හා වෙළඳ කටයුතු, අධ්‍යාපන කටයුතු, තැපැල් හා ප්‍රසිද්ධ වැඩ කටයුතු යන විධායක කාරක සභාවන්ය. මෙම කාරක සභාවන්



අතරින් ස්වදේශ කටයුතු, සෞඛ්‍ය හා කෘෂිකර්ම කටයුතු සදහා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ තෝරාපත් කරගන්නා ලද මන්ත්‍රීවරුන්ට පවරා දීමත් ඉතා වැදගත් විධායක අංග වන රාජය පරිපාලනය, විදේශ කටයුතු හා ආරක්ෂක කටයුතු මහ ලේකම්ටත් මූල්‍ය පාලනය මුදල්ලේකම්ටත් නීති අංශයට අදාල කටයුතු නීති ලේකම්ටත් යනාදී වශයෙන් පවරා දීමත් නිසා ඩොනමෝර් කොමිසම විසින් ලබාදෙන ලද ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සීමිත වගකීම් සහිත ආණ්ඩු ක්‍රමයක් බව පැහැදිළි කරුණකි. කෙසේ වෙතත්මෙබඳු සංයුතියකින් හෙබි ඩොනමෝර් ප්‍රතිංස්කරණ තුළ යෝජිත අමාත්‍ය මණ්ඩලයට සාමාජිකයන් දස දෙනෙකු අයත් විය. විධායක කාරක සභා හතෙහි සභාපතිවරුන් සහ රාජ්‍ය නිලධාරීන් තිදෙනා එකී සාමාජිකයෝ වූහ. මහ ලේකම් අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා විය.

ලාංකික ඇමතිවරුන් බොහෝදුරට රටේ සුභසිද්ධිය උදෙසා කටයුතු කළ අතර රාජ්‍ය නිලධාරීන් තිදෙනා අධිරාජ්‍යයේ උවමනා එපාකම් අනුව කටයුතු කිරීම නිසා ඇතිවූ කඹ ඇදීම රාජ්‍ය මන්ත්‍රණ සභා පළමුවාරයේ කැපී පෙනෙන ලක්ෂණ විය. ඇමතිවරුන්ගේ දෝෂ දර්ශනයට බොහෝවිට ලක් වූයේ මුදල් ලේකම්ය. එයට හේතුවූයේඅනාගත දේශපාලන ජීවිතය තහවුරු කරගැනීම සඳහා යම් යම් සංවර්ධන කටයුතුවලට ඇමතිවරු මුදල් ඉල්ලා සිටි විට මුදල් ලේකම්ට එය නොරිස්සුම් වීමයි. දේශපාලන විචාරකයෙකු වන නවසිවායම් මහතා මෙම රාජ්‍ය නිලධාරීන් තිදෙනා අධිරාජ්‍යය ආරක්ෂා කරන මුරබල්ලන් වශයෙන් හැඳින්වූයේ උක්ත කාරණාවන් නිසා වන්නට ඇත.

## ඩොනමෝර් ප්‍රතිසංස්කරණ ප්‍රතිඵල හරහා සෝල්බරි ප්‍රතිසංස්කරණ පැමිණීම

ලාංකීය නායකයෝ ඩොනමෝර් ආණ්ඩුක්‍රමයෙහි අංශ දෙකක් කෙරෙහි විරෝධය දක්වූහ. රාජ්‍ය නිලධාරීන් තිදෙනාට පවරා තිබූ කාර්යාංශ සහ ඔවුන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට නිල බලයෙන් පත්වීම එම අංශ දෙකයි. එපමණක්ම නොවේ ආණ්ඩුකාරයාට තිබූ බලතල ද විවේචනය කළ ඔවූහු මෙය අර්ධ

වගකීම් සහිත ආණ්ඩු ක්‍රමයක් බව පුන පුනා කියා සිටියහ. කෙසේ නමුත් 1936 දී දෙවන රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවන විට එහි ක්‍රියාකාරීත්වයේ යම් පරිණත බවක් පෙනෙන්නට තිබුණි. මේ අතර බ්‍රිතාන්‍යය දෙවන ලෝක යුද්ධයට මුහුණදීමෙන් ඇති වූ තත්ත්වයන් නිසා යුධ මණ්ඩලයක් පිහිටුවනු ලැබීය. එම මණ්ඩලයට ආණ්ඩුකාරයාත් රාජ්‍ය නිලධාරීන් තිදෙනාත් අමාත්‍ය මණ්ඩලයත් යුධ, නාවික හා පොලිස් ප්‍රධානීන් තිදෙනාත් සිවිල් ආරක්‍ෂක කොමසාරිස්වරයාත් ඇතුළත් විය. මෙකල ලංකාව ජාත්‍යන්තර යුධ කඳවුරක් බවට පත්ව තිබුණු නිසා එවකට ආණ්ඩුකාරයා වූ ඇන්ඩෘ කොල්ඩ්කෝට් (1937-1944) මෙරට ජන නායකයන් සමඟ සහයෝගයෙන්ක්‍රියාකිරීම ලංකා පාලන තන්ත්‍රයේ සාමූහික වගකීම දියුණුවීමට බොහෝදුරට හේතුවිය.

අත්හදා බැලීමක ස්වරූපයෙන් ක්‍රියාත්මක වූ ඩොනමෝර් ආණ්ඩුක්‍රමයෙන් මෙරට ප්‍රජාවගේ සුභසිද්ධිය සඳහා යම් යම් සේවාවන් සිදු වී තිබුණි. සමාජයේ වැඩිපිරිසකට 1945 නිදහස් අධ්‍යාපන පනත මඟින් අධ්‍යාපන අවස්ථා උදාවීම, පළාත් පාලන ආයතන සංවර්ධනය වීම, නිදහස් සෞඛ්‍ය සේවා ඇති වීම, වියලි කලාපයේ සංවර්ධනය සඳහා ගොවිජනපද පිහිටුවීම, යන අංශ හරහා මෙරට සංවර්ධනයට ප්‍රාමාණික සේවයක් ඉටුවිය.

ඩොනමෝර් ආණ්ඩුක්‍රමයප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳ ඉල්ලීම් 1932 සිටම ඉදිරිපත් විය. මූලික වශයෙන් සමාන ස්වරූපයෙන් යුතු මෙම ඉල්ලීම් අතර රාජ්‍ය නිලධාරීන් තිදෙනාගේ තනතුරු අහෝසි කිරීම, ආණ්ඩුකාරයාගේ බලතල අඩුකිරීම, විධායක කාරක සභාව වෙනුවට කැබනට් ක්‍රමයක් ඇතිකිරීම, රාජ්‍ය මන්ත්‍රණ සභාවට මුදල් පරිපාලනය පැවරීම,රාජ්‍ය සේවා කොමිෂන් සභාව ප්‍රතිසංවිධානය කිරීම යනාදිය වැදගත් විය. ඇමති මණ්ඩලය ඉදිරිපත් කළ මෙම යෝජනා වලට උඩ රට සිංහල නායකයෝ ද මුස්ලිම්, බර්ගර්, ද්‍රවිඩ යන සුළු ජාතිකයෝ ද විරුද්ධ වූහ. ප්‍රතිසංස්කරණ පිළිබඳව මෙරට නායකයින් අතර එකගත්වයක් නැති බවත් ඒවා සුළු



ජාතික අයිතිවාසිකම් වලට පටහැනි බවත් මෙරට තවමත් පූර්ණ වගකීම් සහිත ආණ්ඩුවකට පරිණත බවක් ලබා නොමැති බවත් දක්වමින් එම යෝජනා ප්‍රතික්‍ෂේප කළ යුතු යැයි ඔවූහු යටත් විජිත ලේකම්ට දන්වා සිටියහ. ප්‍රදේශ මූල ඡන්ද ක්‍රමය නිසා බහුතර ජාතියේ බලය තහවුරු වී ඇති බව දක්වූ සුළු ජාතික නායකයෝ බහුතර ජාතියට අයත් මන්ත්‍රී සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් තමන්ට ද ලැබෙන ලෙස ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ප්‍රතිසංස්කරණය කළ යුතු බව කියා සිටියහ.

දෙවන ලෝක යුද්ධය ඇරඹීමත් සමඟ යටත් විජිතවාසීන්ගේ පක්‍ෂපාතීත්වය හා සහයෝගීත්වය බ්‍රිතාන්‍යන්ට අත්‍යවශ්‍ය වූ හෙයින් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කෙරෙහි දක්වූ දැඩි ආකල්ප වෙනස්කර ගැනීමට බ්‍රිතාන්‍ය කිරීටයට සිදු විය. ආණ්ඩු ක්‍රමය පිළිබඳ ගැටලු පරීක්‍ෂාකොට වාර්තාවක් සැපයීමට අනුමැතිය ලබාගත් ඇන්ඩෘ කොල්ඩ්කෝට් 1938 ජුනි මාසයේදී යටත් විජිත ලේකම් වූ මැල්කම් මැක්ඩොනල්ඩ් වෙත ප්‍රතිසංස්කරණ නිර්දේශ වාර්තාවක් ඉදිරිපත් කළේය. තමන් විසින් ඉදිරිපත් කරණ ලද ප්‍රධාන ඉල්ලීම් ඉටුනොවීම නිසා එකී යෝජනාවලට සිංහල නායකයෝ සහ සුළු ජාතික නායකයෝ විරෝධය පල කළහ. මේ අතර යුධමය තත්ත්වය දීර්ඝ වීම නිසා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ කාලය දීර්ඝ කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුව යුද්ධය අවසන් වූ වහාම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඇතිකරණ බවට පොරොන්දු වීය.

සිංගප්පූරුව ජපානයට යටත් වීමෙන් පසුව අග්නි දිග ආසියාවේ ප්‍රධාන අණදෙන නිලධාරී ලුවී මවුන්ට්බැටන් සාමිවරයා තම මූලස්ථානය ලංකාවේ පිහිටුවා ගත්තේය. 1942 ලංකාවේ හමුදාපති ලෙස පත්වීම ලද ජෙෆ්රි ලේටන් මෙරට යුධ මණ්ඩලයේ සාමාජික ඕ. ඊ. ගුණතිලක මහතා සිවිල් ආරක්‍ෂක කොමසාරිස් ධූරයට පත් කළේය. මෙම පත් කිරීම් නිසා බ්‍රිතාන්‍ය ලාංකික සුහදත්වයක් සහ විශ්වාසයක් ගොඩනැගී ලාංකීය නායකයන්ගේ පූර්ණ සහයෝගය බ්‍රිතාන්‍යන්ට ලැබුණි. මේ සබඳතා පසුකාලීන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කෙරෙහි හිතකර ලෙස බලපෑවේය.

ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉල්ලා ප්‍රබල හඬක් නැගූ ලංකා වාමාංශික ව්‍යාපාරයේ 1935 දී බිහි වූ ලංකා සමසමාජ පක්ෂයේ නායක එන්. එම්. පෙරේරා සහ පිලිප් ගුණවර්ධන ප්‍රමුඛ කණ්ඩායම මෙම සහයෝගීතා ප්‍රතිපත්තිය ප්‍රතික්ෂේප කළේය. බ්‍රිතාන්‍යන්ට විරුද්ධව ස්වරාජ්‍යයක් ඉල්ලා උද්ඝෝෂණ ගෙන ගිය සමසමාජ නායකයින් 1940 ජූනි මාසයේ ආරක්ෂක කටයුතු රෙගුලාසි යටතේ සිරභාරයට ගත් අතර 1942 දී සමසමාජ පක්ෂය තහනම් කළේය. එහෙත් ස්ටාලින්වාදී දොස්තර එස්. ඒ. වික්‍රමසිංහ සහ වෛද්‍යලිංගම් ප්‍රමුඛ සමසමාජ පක්ෂයේ අනෙක් කණ්ඩායම පක්ෂයෙන් ඉවත්ව කොමියුනිස්ට් පක්ෂය පිහිටුවාගෙන යුද්ධ කාලයේ ඉංග්‍රීසීන්ට සහය දැක්වීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. මෙලෙස මුලදී බ්‍රිතාන්‍ය විරෝධී වන වාමාංශික පෙරමුණ තාවකාලිකව හෝ බ්‍රිතාන්‍යවාදී වන අයුරු හඳුනාගත හැකිය.[22]

ඩොනමෝර් ක්‍රමය යටතේ වර්ධිත තත්ත්වයන් හමුවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සඳහා බලපෑම් කරණ ලද තවත් වැදගත් සිද්ධියක් නම් එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ ප්‍රමුඛත්වයෙන් 1937 සිංහල මහා සභාව පිහිටුවීමයි. මෙහි ප්‍රමුඛ අරමුණ වූයේ භාෂාව සහ ආගම් කේන්ද්‍රීය කොට ගත් විරාගත සිංහල සංස්කෘතිය යටතේ සිංහල ජාතිය එකමුතු කිරීමයි. බණ්ඩාරනාක, ජේ. ආර්. ජයවර්ධන, ඩඩ්ලි සේනානායක යන මහතුන්ගේ ප්‍රධානත්වයෙන් ලංකා ජාතික සංගමයේම වෙනම කණ්ඩායමක් ලෙස සංවිධානය වූ මොවුන් 1942 පැවති ලංකා ජාතික සංගමයේ වාර්ෂික සම්මේලනයේදී ලංකාවට පූර්ණ නිදහස ලබාගත යුතු යැයි යෝජනාවක් සම්මත කරගත්තේය. මේ අතර කොමියුනිස්ට් පක්ෂය ලංකා ජාතික සංගමයට එකතුවීමත් පූර්ණ නිදහස පිළිබඳ අදහස ඉස්මතු වීමත් හේතුකොටගෙන ලංකා ජාතික සංගමයේ මෙන්ම අමාත්‍ය මණ්ඩලයේ ද ප්‍රමුඛත්වයක් දැරූ ඩී. එස්. සේනානායක මහතා 1943 එම සංගමයෙන් ඉවත් වී ලංකා විශ්ව විද්‍යාලයේ කුලපතිවූ සර් අයිවර් ජෙනිංග්ස් සහ ඔලිවර් ගුණතිලක යන මහතුන් සමඟ ආසන්න සබඳතා පවත්වා ගනිමින් ලංකාවට ඩොමීනියන්



තත්ත්වය ලබාගැනීම පිළිබඳව වූ ඉල්ලීම තව දුරටත් ඉදිරියට ගෙන ගියේය.

මෙලෙස ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සම්බන්ධව ලාංකේය නායකයන් අතර ඒකමිතියක් නොතිබුණු නිසා යුද්ධය අවසන් වූ වහාම කොමිෂන් සභාවක් හෝ සාකච්ඡා සභාවක් මගින් තත්ත්වය පරීක්ෂා කරන බවට යටත් විජිත ලේකම් වරයා විසින් පොරොන්දුවක් දෙන ලදී. 1942 මැයි මාසයේ යටත් විජිත කාර්යාලයෙන් නිකුත් වූ ප්‍රකාශයක් මගින් ආරක්ෂක කටයුතු, විදේශ වෙළදාම, නාවික කටයුතු හා මුදල් භාවිතය බ්‍රිතාන්‍ය කිරීටය යටතේ දිගටම පවත්වාගෙන යා යුතුය යන නියමය යටතේ ආණ්ඩු ක්‍රම කෙටුම්පත් සකස් කොට රාජ්‍ය මන්ත්‍රණ සභාවේ 3/4 අනුමැතිය සහිතව ඉදිරිපත් කරණ ලෙසට නියම කරන ලදී. ඒ අනුව ඩී. එස්. සේනානායක ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය සැකසූ යෝජනාවක් 1944 පෙබරවාරි මාසයේදී හෙන්රි මන්ක් මේසර් මුවර් ආණ්ඩුකාරයා මගින් යටත් විජිත ලේකම් වෙත ඉදිරිපත් කෙරුණි. එයට ප්‍රතිචාර වශයෙන් යටත් විජිත ලේකම් ඔලිවර් ස්ටැන්ලි මෙම කෙටුම්පත ගැන පමණක් නොව සුළු ජාතිකයන්ගේ අවශ්‍යතා ඇතුළු සියල්ල සොයා බලා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමට කොමිෂන් සභාවක් පත් කරණ බව බ්‍රිතාන්‍ය මහජන මන්ත්‍රී මණ්ඩලයේදී ප්‍රකාශ විය. මෙය 1944 කොන්දේසි වලට පටහැනි බව පෙන්වූ අමාත්‍ය මණ්ඩලය තම ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ කෙටුම්පත ඉල්ලා අස්කර ගත්තේය. එසේ වුවත් 1944 දෙසැම්බර් මාසයේයේදී සෝල්බරි සාමිගේ නායකත්වයෙන් යුත් ජේ. එෆ්. රීස්, එෆ්. ජේ. බරෝස් යන අයද ඇතුළත් වූ කොමිසමක් මෙරටට පත්කර එවීය.

### සෝල්බරි ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ සහ බලය පැවරීමේ ක්‍රියාදාමය

1947 සිට 1972 දක්වා කාලපරාසය තුළ ලංකාවේ ක්‍රියාත්මක වූ ආණ්ඩු ක්‍රමය නිර්මාණය වන්නේ මෙකී ප්‍රතිසංස්කරණ හරහාය. ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයන් පිළිබඳව අමාත්‍ය මණ්ඩලය බ්‍රිතාන්‍යයන්ට නොකඩවා කරුණු කියා සිටීම, දෙවන

ලෝක යුද්ධයේ බලපෑම, ඉන්දීය නිදහස් සටන් ව්‍යාපාරය, බ්‍රිතාන්‍ය විදේශ ප්‍රතිපත්තිය ආදියෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1944 දෙසැම්බර් සෝල්බරි කොමිසම ලංකාවට ළඟා විය. එම කොමිසම සැකසූ වාර්තාව, ලංකා අමාත්‍ය මණ්ඩලය විසින් ඉදිරිපත් කොට ඉල්ලා අස්කර ගන්නා ලද ව්‍යවස්ථා කෙටුම්පතට එතරම් පරස්පර විරෝධී නොවූ නිසා කොමිසම විසින් නිර්දේශ කළරාජ ආඥාව (1946) ඇමති මණ්ඩලය පිළිගත්තේය. මෙලෙස සෝල්බරි කොමිසම හෙවත් රාජ ආඥාව (1946) නිසා ලංකාවට වෙස්ට් මිනිස්ටර් ක්‍රමයේ පාර්ලිමේන්තු ක්‍රමයක් දායාද විය.[23]

සෝල්බරි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ලිඛිත ව්‍යවස්ථාවක් වූ අතර එහි ප්‍රධාන වශයෙන්ම ගැබ් වී ඇත්තේ 1947 ලංකා නිදහස් පනත, 1946 රාජ ආඥාව යන අණ පනත්ය. මෙයින් වඩාත්ම වැදගත් ලෙස සැලකෙන්නේ 1946 ලංකා රාජ ආඥාවයි. එහි ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ යන ත්‍රිවිධ අංශ වල කටයුතු, මණ්ඩලවල බලය, අග්‍රාණ්ඩුකරතුමා පත්කිරීම හා එතුමාගේ බලතල ආදී ප්‍රධාන කරුණු විස්තරකොට තිබේ.

මෙම ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරයෙහි හඳුනාගත හැකි තවත් වැදගත් අංගයක් වනුයේ මන්ත්‍රීවරු 101 දෙනෙකුන් සැදුණු නියෝජිත මන්ත්‍රී මණ්ඩලයක් හා උත්තර මන්ත්‍රී මණ්ඩලයක් පිහිටු වීමණි නූතන කැබිනට් ආණ්ඩුක්‍රමය ඇතිකිරීම, සුළු ජාතීන්ගේ ආරක්ෂාව සඳහා විධි විධාන සැලසීම, රාජ්‍ය හා අධිකරණ සේවා කොමිෂන් සභා දෙකක් පිහිටුවීමත් යන මේවාය. තවද අභිනව ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා පක්ෂ ක්‍රමයක අවශ්‍යතාවය පැන නැගුනෙන් ඒ සඳහා මාර්ගය ද මෙම ප්‍රතිසංස්කරණ තුළින් නිර්මාණය කෙරුණි. මෙම ආණ්ඩුක්‍රමය යටතේ හඳුන්වාදුන් පාර්ලිමේන්තු ක්‍රමය අංග තුනකින් යුක්ත විය. ඒ මහ රැජින, උත්තර මන්ත්‍රී මණ්ඩලය, නියෝජිත මන්ත්‍රී මණ්ඩලය යනුවෙනි. රාජ්‍ය මන්ත්‍රණ සභාව අහෝසි කළ සෝල්බරි කොමිසම ඒ වෙනුවට නියෝජිත මන්ත්‍රී මණ්ඩලයක් පිහිටුවීය. මෙහි නියෝජනය වූ මන්ත්‍රීවරු 101 දෙනාගෙන් 95 දෙනෙකු ඡන්ද බලයෙන් තෝරා පත්කරගත් අතර සෙසු 06

16 OCT 2017
පුස්තකාලය



දෙනා ආණ්ඩුකාරයා විසින් සුළු ජාතීන්ගෙන් තෝරා පත්කරගන්නා ලදී.

මෙම ව්‍යවස්ථාදායකය ද්වි මණ්ඩලීය ආයතනයක් විය. මෙහි දෙවන මණ්ඩලය, උත්තරමන්ත්‍රී මණ්ඩලය හෙවත් සෙනට් සභාව වශයෙන් හඳුන්වනු ලැබීය. මෙය මන්ත්‍රීවරු තිස්දෙනෙක්ගෙන් යුක්ත වුවත් ඒ කිසිවෙකුත් සෘජුවම මහජන ඡන්දයෙන් තෝරා පත්කරගත්තේ නැත. පහළොස්දෙනෙකු අගමැතිගේ උපදෙස් පරිදි අග්‍රාණ්ඩුකාරයා විසින් පත් කළ අතර ඉතිරි පහළොස්දෙනා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ඡන්දයෙන් පත් කෙරුණි. මෙම සභිකයන්ගේ උපරිම සේවා කාලය වසර හයක් පමණ විය.

සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලැබූ අධිකරණ ව්‍යුහය මතු දැක්වෙන පරිදි සටහන් කළ හැකිය. එනම් රාජාධිකරණ, අපරාධ නඩු පිළිබඳ ඇපිල් උසාවිය, ශ්‍රේෂ්ඨාධිකරණය, දිස්ත්‍රික් උසාවිය, මහේස්ත්‍රාත් උසාවිය, රික්වෙස්ට් උසාවිය, ගම්බද උසාවිය ආදියයි. ලංකාව ඩොමීනියන් රාජ්‍යයක් වූ බැවින් අවසාන අභියාචනාධිකරණය වූයේ බ්‍රිතාන්‍ය රාජාධිකරණයයි.

කෙසේවෙතත්මෙම ආණ්ඩුක්‍රමය පිළිබඳව ද නොයෙක් විවේචන එල්ලවන්නට විය. උත්තර මන්ත්‍රී මණ්ඩලය පිළිබඳව ද ව්‍යවස්ථාදායක සභාවේ වලංගුතාවය පිළිබඳව ද නොයෙක් ගැටලු මතු විය. කෙසේ වෙතත් ඒ දක්වා ඉදිරිපත් වූ සියලු ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ අතින් ව්‍යුහාත්මක මෙන්ම ප්‍රායෝගිකව ද වර්ධනීය තත්ත්වයක් පෙන්නුම් කළ ආණ්ඩුක්‍රමයක් ලෙස සෝල්බරි ආණ්ඩුක්‍රමය හඳුනාගත හැකිය.

## බලය පැවරීමේ ක්‍රියාවලිය

ලාංකියන් අතට බලය පැවරීමේ මූලිකම ක්‍රියාදාමය පූර්වයෙන් පෙන්වාදෙන ලද 1946 රාජ ආඥාවයි. එය ප්‍රදානය කරමින් බ්‍රිතාන්‍යය ප්‍රකාශ කොට සිටියේ ඉතා ඉක්මනින් ලංකාවට ඩොමීනියන් තත්ත්වය ලබාදෙන බවය. ඩොමීනියන් තත්ත්වය යනු බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලය තුළ රැඳී සිටින

සම්පූර්ණ නිදහස් රාජ්‍යයන්ය. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවෙන් සම්මත වූ වෙස්ට් මිනිස්ටර් ප්‍රඥප්තිය අනුව ඩොමිනියන් තත්ත්වය නීතිගත කරන ලදී.ඩොමිනියන් තත්ත්වය ලද රටකට තම රටට අවශ්‍ය නීති සම්පාදනය කිරීමේ බලය, ඕනෑම රටක් හා ගිවිසුම්වලට එළඹීමේ බලයක් හා යුධ ප්‍රකාශ කිරීමේ බලය ද පැවරේ. ලංකා රාජ්‍ය මන්ත්‍රණ සභාවට මෙකී බලතල හිමිවූයේ 1948 පෙබරවාරි 04 වන දින ලංකාව ඩොමිනියන් රාජ්‍යයක් බව ප්‍රකාශකිරීමෙන් පසුවය. ලංකාවට ඩොමිනියන් තත්ත්වය පිරිනැමීමේදී බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව විසින් පනත් හතරක් සම්මත කරගන්නා ලදී. මෙම පනත් හතර සම්මතවීමෙන් පසුව සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ස්වෛරීත්වය සීමා කිරීමට යොදා තිබුණු බාධා ඉවත් කරණ ලදී. මෙම ක්‍රමට ලංකාවට අර්ධ බලය සහිත පාලන ක්‍රමයක් ලැබුණු අතර එය එසේ වීම පසුපස පෞද්ගලිකවම සිදුකරන ලද කැපකිරීම් පිළිබඳ සිදුවීම් රැසක් පවතී.

ඒ අතර ප්‍රධාන කථාවක් සැකෙවින් මෙසේය. පූර්වයෙන් සඳහන් කළ පරිදි 1946 රාජ ආඥාව මගින් මෙරටට වගන්ති 92 කින් සමන්විත සෝල්බරි ප්‍රතිසංස්කරණ ලැබුණි. නව ආණ්ඩු ක්‍රමය යටතේ මහ මැතිවරණයක් පැවැත්වීමට 1947 අගෝස්තු මාසයට නියමිත විය. මෙම මැතිවරණයේදී ඩී. එස්. සේනානායක මහතාගේ නායකත්වයෙන් පිහිටුවන ලද එක්සත් ජාතික පක්ෂයට ආසන 95 න් 42 ක් දිනා ගැනීමට හැකිවිය. ඒ අනුව ඩී. එස්. සේනානායක මහතා අගමැති බවට පත්විය. මෙතැන් පටන් නව ආණ්ඩුවේ ප්‍රධාන කාර්යය වූයේ නිදහස ලබා ගැනීමයි. මේ සඳහා ඩී. එස්. සේනානායක මහතා හා ඔලිවර් ගුණතිලක මහතා අතර දිගටම සාකච්ඡා පැවැත්වුණි.

ලංකාවට ඩොමිනියන් නිදහස ලබාගැනීම සඳහා විශාල මෙහෙවරක් සිදු කළශ්‍රීමත් ඔලිවර් අර්නස්ට් ගුණතිලක මහතා 1947 එංගලන්තයට ගොස් ලංකාණ්ඩුව සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වීය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ලංකාවේ නිදහස සම්බන්ධ ගිවිසුමක් ඇතිකරගත් අතර ඒ සඳහා 1947 නොවැම්බර් 11 වන දින ඉංග්‍රීසි රජය වෙනුවෙන් එවකට ලංකාණ්ඩුකාර ධූරය දැරූ



හෙන්රි මුවර් ද ලංකාණ්ඩුව වෙනුවෙන් එවකට අගමැති ඩී. එස්. සේනානායක ද අත්සන් තබන ලදී. ඒ අනුව 1948 පෙබරවාරි 04 වන දින ගිවිසුම ක්‍රියාවේ යෙදවීය.[24]

මෙලෙසින් ලංකාවට ඩොමිනියන් නිදහස හිමිවිය. වර්තමානය දක්වාම ජාතික නිදහස් දිනය ලෙස පෙබරවාරි 04 වන දින සමරන්නේ එහෙයිනි. එසේම මෙදින සිට මෙරටට පොදුරාජ්‍ය මණ්ඩලයේ සාමාජිකත්වය ද ලැබුණි. පූර්වයෙන් සඳහන් කරන ලද ආකාරයේ බලතල සහිත ඩොමිනියන් නිදහස ලංකාව විසින් දිනාගත්ත ද එය අර්ධ රාජ්‍ය බලය පැවරීමකි. මනිද ලංකා රාජ්‍යයේ උත්තරීතර ආයතනය බ්‍රිතාන්‍ය කිරීටය වූ බැවිනි. 1833 න් ඇරඹි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ උච්ඡතම අවස්ථාව වූ 1947 සෝල්බරි ප්‍රතිසංස්කරණ මෙලෙස පෙන්වා දිය හැකිය.

### ලංකාවට පූර්ණ බලය පැවරීම (පවරා ගැනීම)

ප්‍රජාතන්ත්‍රීය ලක්ෂණ විද්‍යමාන වුවත් සෝල්බරි ආණ්ඩු ක්‍රමය ද රාජාණ්ඩුවකි. ලංකාණ්ඩුවේ උත්තරීතර බලය පැවතියේ බ්‍රිතාන්‍ය ආණ්ඩුව සතුවය. 1948න් පසු ලංකාවට අර්ධ බලයක් ලැබුණු අතර එම අර්ධ බලය පූර්ණ බලයක් ලබාගැනීම දක්වා යන ගමන 1948 සිට 1972 දක්වා ක්‍රියාත්මක වීය. එසේ අවුරුදු 22 කක ලංකා පාලන සමය තුළ ක්‍රමිකව සිදු වූ විපර්යාසයන් සහ එංගලන්තයේ ඇතිවූ දේශපාලනමය තත්ත්වයන් මත ලංකාවට පූර්ණ බලාධිකාරීත්වයක හිමිකම පැවරුණි. මෙහිදී ලංකාව තුළ වර්ධිත දේශපාලන තත්ත්වයන් පූර්ණ නිදහස ලබාගැනීමේදී අතිශය වැදගත් වූ බව හඳුනාගත හැකිය.

ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ වර්ධනයේ තීරණාත්මක සන්ධිස්ථානයක් සනිටුහන් කළ වසරක් ලෙස 1972 වසර හඳුනාගත හැකිය. සිරිමාවෝ රත්වත්තේ මැතිනියගේ නායකත්වයෙන් බලයට පැමිණි සමගි පෙරමුණ විසින් ව්‍යවස්ථා ප්‍රකාරව 2/3 කක බලයක් ලබාගනිමින් ප්‍රථම වරට බටහිර මැදිහත් වීමකින් තොරව දේශීය ක්‍රමයට ව්‍යවස්ථාවක් සම්මත

කරගන්නා ලදී. එම ව්‍යවස්ථාවේ මතු දැක්වෙන විමර්ශනයන් තුළ ලංකාව ස්වෛරී රාජ්‍යයක් බවට පූර්ණ වශයෙන් පත්වූයේ කෙසේදැයි තහවුරු වනු ඇත.

1. ' ශ්‍රී ලංකාව නිදහස් ස්වෛරී ස්වාධීන රාජ්‍යයකි ' යි එකී ව්‍යවස්ථාවේ පළමුවන වගන්තිය ප්‍රකශ කරයි. 1948 ලංකාවට ලැබුණ අර්ධ බලය පැවරීම ඒ හරහා අහෝසි වී ඇත. ලංකාව ස්වාධීන ජනරජයක් බවට පත්ව ඇත.

2. 1946 සෝල්බරි ව්‍යවස්ථාව අනුව බලය උපදින්නේ කිරීටයෙනි. නමුත් 1972 ව්‍යවස්ථාවේ බලය උපදින්නේ ජනතාවගෙනි. ඒ බව තුන්වන වගන්තියේ මෙසේ දැක්වේ. ' ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍ය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේය, ඒ පරමාධිපත්‍යය අත්හල නොහැක්කේය'. යනුවෙනි.

3. ජනතාවගේ පරමාධිපත්‍ය බලය එනම් ත්‍රිවිධ බලය ජාතික රාජ්‍ය සභාවට පවරා ඇති බවත් එහි නාමකරණයෙන් පත් කළ කිසිදු නියෝජිතයෙකු නැති බවත් ජනතා නියෝජිතයන්ගෙන් පමණක් සමන්විත බවත් හතරවන වගන්තිය ප්‍රකාශ කරයි. සෝල්බරි ව්‍යවස්ථාවේ නාමකරණයෙන් පත්කල මන්ත්‍රීවරු සිටිය නිසා එය ජනරජයක් නොවේ.

4. ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ජාතික රාජ්‍ය සභාව මගින් දජනතාවගේ විධායක බලය ජනාධිපතිවරයා ඇතුළු අමාත්‍ය මණ්ඩලය මගින් ද ජනතාවගේ අධිකරණ බලය ජාතික රාජ්‍ය සභාව විසින් පිහිටුවනු ලැබූ අධිකරණ ආයතන මගින් ද ක්‍රියාත්මක කරණ බව ව්‍යවස්ථාවේ පස්වන වගන්තියෙන් ප්‍රකාශ වේ.

5. සෝල්බරි ව්‍යවස්ථාවේ රැජිනගේ නියෝජිතයා ලෙස අග්‍රාණ්ඩුකාරයා පෙනී සිටි නමුත් 1972 ව්‍යවස්ථාවෙන් පෙනී සිටියේ ලංකාවේ ඡන්ද බලය හිමි කවර හෝ පුරවැසියෙකි. ඔහු මෙරට නායකයා මිස වෙනත් රටක නියෝජිතයෙකු හෝ පුරවැසියෙකු නොවේ.



6. සෝලබරි ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවට ස්වාධිපති බලය හිමි වූ අතර ලංකාවේ අවසාන අභියාචනාධිකරණය බ්‍රිතාන්‍යයේ ප්‍රිවි කවුන්සිලය විය. රාජ්‍ය සේවකයින් හා විනිශ්චය කරුවන් දිවුරුම් දෙන ලද්දේ රැජිනගේ නමිනි. නමුත් 1972 න් පසු ඒ සියලු බැඳීම්වලින් නිදහස් විය.

07. 1972 ව්‍යවස්ථාව සම්පාදනය වූ ආකාරයෙන් ද ලංකාව ස්වාධීන විය. 1970 බලයට පැමිණි සමගි පෙරමුණු ආණ්ඩුව ලංකාව ස්වෛරී රාජ්‍යයක් කිරීම සඳහා ජනතාවගෙන් වරමක් ඉල්ලා සිටියේය. මැතිවරණයේදී 2/3 කක බලයක් ලැබූ ආණ්ඩුව සියලු ජනතා නියෝජිතයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් ලෙසින් නව රඟහලේ රැස්කොට 1972 ව්‍යවස්ථාව කලේය.[25]

මෙකී තොරතුරු හමුවේ ලංකාව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හරහා පූර්ණ බලය හිමිස්වෛරී රාජ්‍යයක් බවට පත් වනුයේ කෙසේදැයි 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කරණ ලද අයුරු මැනවින් වටහාගත හැකිය.

## නිගමනය

1833 කොල්බෲක් කැමරන් යෝජනාවලින් ආරම්භය සනිටුහන් කරනු ලබන ලාංකේය ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉතිහාසය තුළදශක 14 ක් තරම් විසල් කාලපරාසයක් පුරාවට ක්‍රමිකව විකාශනය වූ ආකාරය පූර්ව මාතෘකාවන් තුළදී සාකච්ඡාවට බඳුන් කොට තිබේ. ඒ තුළ පැහැදිළිවම පෙනෙන්නේ මුල්කාලීනව බ්‍රිතාන්‍යන්ට පාලනයේ පහසුව පිණිස හඳුන්වාදුන් ප්‍රතිසංස්කරණ පසුකාලීනව නොදී බැරි තත්ත්වයට පත්වූ බවයි. ඒ බව 1972 ව්‍යවස්ථාව හැරෙන්නට අන් සියලු ප්‍රතිසංස්කරණ සඳහා බ්‍රිතාන්‍යය සෘජුවම මැදහත් වීමෙන් තවදුරටත් පැහැදිලිවේ. එසේම ක්‍රමානුකූලව බ්‍රිතාන්‍යන් වෙතින් ලංකාවේ පාලනය ලාංකිකයන් වෙතට මාරුවන ආකාරය ද හඳුනා ගත

හැකිය. එකී මාරුවීම පියවරෙන් පියවර ඉතා පැහැදිලිව සිදුව ඇති අයුරු ද මනාව හඳුනාගත හැකිය. 1818 හා 1848 වසරවලදී සිදු වූ අරගල හැරෙන්නට අවියෙන් නිදහස උදෙසා අරගල සිදු නොකළ ලාංකිකයන් පසුකාලීනව ස්වාධීනත්වය උදෙසා සිදුකරණ ලද ව්‍යායාමය සාකච්ඡාමය ස්වරූපයක් ගත්තේය. එම ව්‍යායාමයේ උක්ත ප්‍රතිඵල විසින් පෙන්වාදෙනු ලැබ ඇත්තේ සාකච්ඡා සහ සාමකාමී අයුරින් පරිපාලනමය වශයෙන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ද ආධිපත්‍යයමය වශයෙන් ලේ වැගිරීමකින් තොරව බලය ලබාගන්නා ලද අතීතයකට ලංකාව උරුමකම් කියන බවයි.

## ආන්තික සටහන්

1. H.W. Codrington, **Diary of M.R Jhon D'oyly-Vol. xxv** (Colombo: Ceylon Branch of The Royal Asiatic Society, 1917, 231.
2. ගාමිණී පලිහේන, **යුරෝපය**, නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ, 2013, 261-341.
3. පී.ඩී. කන්නංගර, **කෝල්බෲක් කැමරන් පිළිබඳ විමර්ශනයක්**, විද්‍යෝදය විශ්ව විද්‍යාලය ඉතිහාස සඟරාව, සංස්. වලත්වැවේ දේවානන්ද හිමි, පිටකෝට්ටේ: බැප්ටිස් මුද්‍රණාලය, 1964, 206.
4. **යුරෝපයේ ඉතිහාසය**, බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2004, 144.
5. පී. ඩබ්. ජයතිලක, **යුරෝපා ඉතිහාසය**, යක්කල: විශ්ව ප්‍රකාශකයෝ, 2013, 250.
6. පී. ඩබ්. ජයතිලක, 250.
7. තිස්ස ඊරියගම, **බටහිර ලෝකයේ නූතන ඉතිහාසය**, දන්කොටුව: වාසනා ප්‍රකාශකයෝ, 2011, 293.
8. G.C. Mendis, **The Colebrook -Cameron papers**, oxford university press, 1956, 02.
9. කේ. ඩී. ජී. විමලරත්න, **ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය ආධිපත්‍ය**, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ, 1993, 59
10. කේ. ඩී. ජී. විමලරත්න, 59.
11. කේ. ඩී. ජී. විමලරත්න, 61.



12. එච්. ටී. බස්නායක, ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය 03, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2005, පි. 82
13. කේ. ඩී. ජී. විමලරත්න, 64-75.
14. එච්. ටී. බස්නායක, එම, පි. 102
15. බී. සී. පෙරේරා, ලංකාවේ පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය, කොළඹ: ලංකාණ්ඩු මුද්‍රණාලය, 1964, 13.
16. එච්. ටී. බස්නායක, එම, 104.
17. කේ. ඩී. ජී. විමලරත්න, 162.
18. එස්. නවසිවායම්, ලංකාවේ ව්‍යවස්ථාදායක සභා I වන වෙලුම, මහරගම: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්ථමේන්තුව, 1970, 18.
19. එස්. නවසිවායම්, 18.
20. රෝහණ මද්දුමරාළ, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම විකාශනය, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 2000, 17.
21. ලයනල් සරත්, නිදහස් ලංකාවේ මූලධර්ම, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2009, 57.
22. ලයනල් සරත්, 153.
23. ආනන්ද කුමාර, ශ්‍රී ලංකාවේ දේශපාලන ගමන් මග සහ පක්ෂ ක්‍රමයේ ව්‍යාප්තිය, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1999, 278.
24. එච්. ටී. බස්නායක, 136.
25. උපාලි ශ්‍රී ආනන්ද, 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, හෙට්ටිමුල්ල, උපාලි ශ්‍රී ආනන්ද, 2005, 08.